## මහින්ද චින්තන:

නව ශ්‍රී ලංකාවක් කරා ...........

# දස අවුරුදු දැක්ම
# සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
# 2006 - 2016
## (සංක්ෂිප්ත සටහන)

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

මහින්ද චින්තන:

නව ශ්‍රී ලංකාවක් කරා ...........

# දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව 2006 - 2016

(සංක්ෂිප්ත සටහන)

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

This book is brought from my home town. on 14/5/2010.

17/5/2010

ප්‍රථම මුද්‍රණය: 2008


| | |
|---|---|
| පරි. අංක | 6688 |
| වර්ග අංක | 320.6 |
| දිනය | |


මුද්‍රණය: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.

# පටුන

පිටු


| | |
|---|---|
| කෘෂිකාර්මික සංවර්ධනය | 01 |
| කර්මාන්ත සංවර්ධනය | 09 |
| ආර්ථික යටිතල පහසුකම් | 13 |
| සංචාරක කර්මාන්තය | 21 |
| නාගරික සංවර්ධනය හා නිවාස | 23 |
| ජීවනෝපාය සංවර්ධනය සහ සමාජ ආරක්ෂණය | 26 |
| ශ්‍රම සම්පත් සහ රැකියා උත්පාදනය | 29 |
| අධ්‍යාපනය | 31 |
| සෞඛ්‍යය | 35 |
| සංස්කෘතික කටයුතු | 39 |
| ක්‍රීඩා | 41 |
| විද්‍යාව හා තාක්ෂණය | 44 |
| පරිසර කළමනාකරණය | 46 |
| රාජ්‍ය පරිපාලනය | 49 |
| නීති හා අධිකරණ පද්ධතිය | 52 |
| ගැටුම් වලින් හානියට පත් දිස්ත්‍රික්ක සංවර්ධනය | 54 |
| සාර්ව ආර්ථික දක්ම | 57 |

# 1. කෘෂිකාර්මික සංවර්ධනය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
**2006 - 2016**

සමස්තයක් වශයෙන් කෘෂිකර්ම අංශය තුළින් වාර්ෂිකව 4% - 5% අතර වර්ධන වේගයක් අපේක්ෂා කෙරේ. එමගින් 2016 වන විට ග්‍රාමීය අංශය තුළ ආදායම් උත්පාදන මාර්ග වැඩි කිරීම, ආහාර සුරක්ෂිතභාවය ඇති කිරීම, රටේ සමස්ත ජනතාවගේ ජීවන වියදම අඩුකිරීම සහ දිළිඳු ජනතාව සඳහා සාධාරණ මිළකට ප්‍රමාණවත් ආහාර වේලක් සපයාදීම යනාදිය ඉටුකර ගැනීමට හැකිවනු ඇත. තවද සහලින් රට ස්වයංපෝෂිත කිරීම තේ, රබර් සහ පොල් යන ප්‍රධාන වැවිලි බෝග වල නිෂ්පාදනය ඉහළ නැංවීම හා ඒ තුළින් ඉහළ විදේශ විනිමය ආදායමක් ලබාගැනීම අපේක්ෂා කෙරේ. ග්‍රාමීය ගොවි ජනතාවගේ ආදායම් වැඩිදියුණු කිරීමට ඉවහල් වන තිරසාර කෘෂි කාර්මික වර්ධනයේ ප්‍රධාන අංග සේ සැළකෙන බෝග, පශු සම්පත් හා ධීවර යන ක්ෂේත්‍ර වල නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමද තවත් ප්‍රධාන පරමාර්ථයකි. නිසි වාරි මාර්ග කළමනාකරණය, පුනරුත්ථාපනය හා නව වාරි මාර්ග යෝජනා ක්‍රම හරහා මෙම අංශයෙහි සීඝ්‍ර දියුණුවක් අත්පත් කර ගැනීමට ද බලාපොරොත්තු වේ.

කෘෂිකාර්මික අංශය ප්‍රධාන වශයෙන් වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග වැවිලි බෝග, පශු සම්පත් හා ධීවර යන උප අංශ වලින් සමන්විත වේ.

## වී, අනෙකුත් ක්ෂේත්‍ර බෝග සහ වැවිලි බෝග

## ඉදිරි දැක්ම

ප්‍රශස්ත ලෙස දේශීය ආහාර ද්‍රව්‍ය වලින් ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සහ ජාත්‍යන්තර වෙළඳපොල සඳහා තරඟකාරී ලෙස කෘෂි නිෂ්පාදන සැපයීමට හැකි අංශයක් බවට පත් කිරීම.

## අරමුණු

- යැපුම් කෘෂි කර්මාන්තය වෙළඳපොල අරමුණු කරගත් ඉහළ ඵලදායී අංශයක් බවට පරිවර්තනය කිරීම.
- ශ්‍රී ලාංකීය ජනතාවගේ පෝෂණ තත්වය හා ආහාර සුරක්ෂිතභාවය ඉහල නැංවීම.
- පෞද්ගලික අංශයේ ධාරිතාවය තවදුරටත් වැඩි කරමින් වැවිලි නිෂ්පාදන වල එකතු කළ අගය වැඩි කිරීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම තුළින් විදේශීය වෙළඳපොල තවදුරටත් පුළුල් කිරීම.
- වතු ආශ්‍රිත සහ ග්‍රාමීය ජනතාවගේ ආර්ථික හා සාමාජීය තත්ත්වය වැඩිදියුණු කිරීම තුළින් ඔවුන්ට වැදගත් සමාජ හා ජීවන තත්ත්වයක් ලබාදීම.

## උපාය මාර්ග

- කෘෂි බෝග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පොහොර, සහතික කරන ලද ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය, තාක්ෂණික දැනුම ලබාදීම හා පර්යේෂණ තුළින් කෘෂි බෝගයන්හි නිෂ්පාදන හා නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම.
- සහනදායී ණය ක්‍රම, නව තාක්ෂණික යෙදවුම් සහ නව තාක්ෂණික දැනුම ප්‍රචලිත කරලීම තුළින් කෘෂිකර්මය පාදක කරගත් කර්මාන්ත නංවාලීම.

- යෙදවුම් සහනාධාර, සහතික මිල ක්‍රම, මිලදී ගැනීමේ වැඩසටහන් සහ නොමිලේ වාරි ජලය සැපයීම වැනි ක්‍රියාකාරකම් හරහා පිරිවැයට සමානුපාතිකව කෘෂි නිෂ්පාදන වලින් ලැබෙන ආදායම ඉහළ නැංවීම.
- නව/නැවත/යටි වගා වැඩසටහන් වේගවත් කිරීම, පවතින ඉඩම් පුනරුත්ථාපනය, පොහොර සහනාධාරය සහ සහනදායී ණය යෝජනා ක්‍රම තුළින් කුඩා සහ මහා පරිමාණ වතුවල නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම.
- කර්මාන්තශාලා නවීකරණය, අපනයන දිරිගැන්වීම හා සන්නාම නාම ශක්තිමත් කිරීම තුළින් නිෂ්පාදන විවිධාංගීකරණය හා එකතු කළ අගය ඉහල නැංවීම.

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ව්‍යාපෘති කාලසීමාව | ආයෝජනය රු.මිලියන |
|---|---|---|
| • පොහොර සහනාධාර වැඩසටහන | 2008-2016 | 200,000 |
| • අපි වවමු රට නගමු වැඩසටහන | 2008-2010 | 1,000 |
| • කාබනික පොහොර භාවිතය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන | 2008-2010 | 1,060 |
| • කෘෂි නිෂ්පාදනය පාදක කරගත් කර්මාන්ත සංවර්ධන වැඩසටහන | 2008-2010 | 1,390 |
| • පසු අස්වනු හානි අවම කිරීමේ සහ කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘති | 2008-2010 | 1,300 |
| • වියලි කලාපයේ ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන | 2005-2010 | 3,000 |
| • වැව්ලි සංවර්ධන ව්‍යාපෘති | 2006-2010 | 11,400 |
| • තේ, රබර් සහ පොල් නිෂ්පාදනය හා ඒවායේ ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන | 2008-2012 | 4,000 |

# ධීවර

## ඉදිරි දැක්ම

වර්තමාන හා අනාගත පරපුරෙහි සුභ සිද්ධිය උදෙසා ධීවර හා ජලජ සම්පත් තිරසාර ලෙස උපයෝජනය කිරීම සහ ඒ පිළිබඳව දකුණු ආසියාතු කලාපයේ ප්‍රමුඛයකු බවට ශ්‍රී ලංකාව පත්කරලීම.

## අරමුණු

- දේශීය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුළින්, ජනතාවගේ පෝෂණ තත්වය හා ආහාර සුරක්ෂිතතාව ඉහළ නංවාලීම.
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ මත්ස්‍ය සැපයුමේ ගුණාත්මක භාවය හා ආරක්ෂාව සම්මත ප්‍රමිතින් කරා ඉහළ නංවාලීම.
- ධීවර කර්මාන්තය හා ඒ ආශ්‍රිත කර්මාන්ත මගින් රැකියා උත්පාදනය වැඩි කිරීම සහ ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීම.
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනයෙන් විදේශ විනිමය ඉපයීම ඉහළ නංවාලීම.
- ජලජ සම්පත් ආශ්‍රිත පරිසරය සංරක්ෂණය කිරීම

## අපේක්ෂිත ඉලක්ක

- 2016 වන විට මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 461,033 දක්වා වැඩි කිරීම.
- ඒක පුද්ගල මත්ස්‍ය සැපයුම කි.ග්‍රෑ.24.22 දක්වා වැඩි කිරීම.
- මත්ස්‍ය අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 28,269 දක්වා වැඩි කිරීම.
- ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා අවස්ථා 795,000 දක්වා වැඩි කිරීම.

## උපාය මාර්ග

- නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ගැඹුරු මුහුදේ මත්ස්‍ය අස්වනු නෙලාගැනීම ප්‍රචලිත කිරීම.
- මත්ස්‍ය බීජ නිෂ්පාදනය ප්‍රචලිත කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය මගින් මිරිදිය හා ජලජීවී වගා සංවර්ධනය කිරීම.
- පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම තුළින් ඉස්සන් වගාව හා විසිතුරු මත්ස්‍ය වගාව වැඩිදියුණු කිරීම.
- නවීන තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම හා නවීන පහසුකම් වලින් යුත් ධීවර තොටුපලවල් සංවර්ධනය කිරීම තුළින් පසු අස්වනු හානිය අවම කිරීම.
- මත්ස්‍ය අලෙවිකරණ ජාලය වැඩිදියුණු කිරීම.

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලසීමාව | මුළු ආයෝජනය (රු.මිලියන) |
|---|---|---|
| • පශ්වාත් සුනාමි වෙරළ ප්‍රතිසංස්කරණ හා සම්පත් කළමනාකරණ වැඩසටහන සහ ජීවනෝපාය සහය හා හවුල්වීමේ වැඩසටහන | 2005 - 2011 | 3806 |
| • දික්ඕවිට නව වරාය ඉදිකිරීම. | 2007 - 2009 | 8904 |
| • පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොල පිහිටුවීම.. | 2006 - 2010 | 1440 |
| • මච්යාත්‍රා 02 ක් මිළදී ගැනීම සහ ක්‍රියාත්මක කිරීම. | 2006 - 2008 | 326 |
| • බහුදින යාත්‍රා සඳහා සහනාධාර සැපයීම. | 2006 - 2008 | 325 |
| • ජලජ සම්පත් සංවර්ධනය හා ගුණාත්මක වර්ධන ව්‍යාපෘතිය | 2003 - 2009 | 3000 |

### පශු සම්පත්

### ඉදිරි දැක්ම

ජනතාවගේ පෝෂණ අවශ්‍යතාවයන් සපුරාලීමට හැකිවන පරිදි කිරි සහ අනිකුත් පශු නිෂ්පාදනයන් සුලභ කිරීම.

### අරමුණු

- තරඟකාරී මිලකට පාරිභෝගික ප්‍රජාව සඳහා දේශීය සත්ව නිෂ්පාදන සුලභ කිරීම.
- වසර 2016 වනවිට කුකුළු නිෂ්පාදන ප්‍රමාණය දෙගුණ කිරීම සහ ආනයනික නිෂ්පාදන සමඟ තරඟ කළ හැකි තත්ත්වයට දේශීය නිෂ්පාදන පත් කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රය තුළ නියැලෙන්නන් සඳහා තිරසාර හා සමානාත්මතා පදනමකින් ආර්ථික හා සාමාජීය ප්‍රතිලාභ ලබාදීම.

### උපාය මාර්ග

- වැඩිදියුණු කළ උසස් වර්ගයේ සතුන් හඳුන්වාදීම, අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම හා කාර්යක්ෂම ව්‍යාප්ති සේවයක් ලබාදීම තුළින් සත්ව

පාලන කර්මාන්තය වාණිජ කර්මාන්තයක් බවට පත්කිරීම.

- අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මූල්‍යාධාර ලබාදීම තුළින් අගය එකතු කළ කිරි නිෂ්පාදනය දිරිගැන්වීම.
- සත්ව පාලන කර්මාන්තය කෙරෙහි පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම.
- පෞද්ගලික අංශයට ශුභදායී බදු ප්‍රතිපත්ති හා ආනයන ප්‍රතිපත්ති සකස් කිරීම හා ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා ව්‍යාප්ති සේවා ලබාදීම

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලසීමාව | මුළු ආයෝජනය (රු.මිලියන) |
|---|---|---|
| • කිරි ගම්මාන වැඩසටහන | 2004 – 2010 | 500 |
| • රජයේ පශු වෛද්‍ය සේවාව වැඩිදියුණු කිරීම. | 2008 – 2015 | 2401 |
| • ඉහළ ගුණාත්මක බවකින් යුත් වැස්සි පැටවුන් රැක බලා ගැනීමේ ව්‍යාපෘතිය | 2008 – 2015 | 1430 |

## වාරි මාර්ග

## ඉදිරි දැක්ම

නිසි ජල කළමනාකරණයක් හරහා මතුපිට ජල භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම තුළින් බහුවිධ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් හා අඛණ්ඩ ලෙස ජලය සැපයීමට හැකි වනසේ වාරි අංශය තාක්ෂණික වශයෙන් උසස් සහ වාණිජ වශයෙන් ශක්තිමත් අංශයක් බවට පත්කිරීම.

## ප්‍රධාන ගැටළු

- කෘෂි හා කෘෂි නොවන අංශ වලින් ඉහළ යන ඉල්ලුමට සරිලන ලෙස ප්‍රමාණාත්මකව ජලය සැපයීමට අපොහොසත් වීම.
- ජල භාවිතයේ කාර්යක්ෂමතාවය අඩු මට්ටමක පැවතීම.
- කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය සඳහා ජලය යෙදීමේදී පවතින අකාර්යක්ෂම කළමනාකරණය
- අකාර්යක්ෂම මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සහ ඒවා අවශ්‍ය ප්‍රමාණයට සිදු නොවීම.

- ජල කළමනාකරණය හා සම්බන්ධව පවතින ආයතන අතර සම්බන්ධීකරණය ප්‍රමාණවත් නොවීම.
- ජලය බෙදාහැරීමේ සිදු වන අඩුපාඩු

## ප්‍රධාන අරමුණු

දේශීය කෘෂි ක්ෂේත්‍රයේ නිෂ්පාදන ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ දැමීම තුළින් ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමත්, කෘෂි අපනයනයන් ඉහළ දැමීමටත් හැකි වන සේ වාරි ජල සැපයුම සහතික කිරීම සහ කෘෂි නොවන අංශයන් වෙත ජලය අඛණ්ඩව හා ප්‍රමාණාත්මකව සැපයීම .මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

- දියුණු වාරි තාක්ෂණය තුළින් දැනට තිබෙන සහ නව වාරි යෝජනා ක්‍රමවල ජල ඒකකයක ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම.
- සාර්ථක ඒකාබද්ධ කළමනාකරණ ක්‍රියාවලියක් තුළින් වාරි යෝජනා ක්‍රමවල ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම.
- ජල ඌණ වාරි යෝජනා ක්‍රමවලට සහ අනිකුත් විවිධ අවශ්‍යතාවයන් සඳහා ජලය ලබාදීමේ අරමුණින් ගංගාවල අන්තර් නිම්න සම්බන්ධතාවයක් ඇති කිරීම.

## උපාය මාර්ග

- බිංදු ජල, ඉසුරුම් ජල හා ජල ප්‍රවාහන පද්ධති ප්‍රතිසංස්කරණය වැනි වාරි තාක්ෂණය තුළින් ජල භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- නව වාරි කළමනාකරණ ක්‍රියාවලියට ගැලපෙන අයුරින් ආයතනික මානව සම්පත් සංවර්ධනය.
- ගොවීන්ගේ හා රජයේ සහභාගිත්වය තුළින් ජල කළමනාකරණය වැඩි දියුණු කිරීම සහ දෝනි මට්ටමින් ජල කළමනාකරණ ආයතනික පද්ධති පිහිටුවීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් හා නීති රීති වඩාත් ශක්තිමත් කිරීමෙන් පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම.
- භාවිතයට ගත හැකි කුඩා වැව් සහ අමුණු සංවර්ධනය කිරීමෙන් කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීමට දායකවීම.

වාරි අංශයේ වාර්ෂික ආයෝජනය රු.මිලියන 6-8 ත් අතර පවතින අතර එය යෝජිත මහා පරිමාන ව්‍යාපෘතීන් සමගින් දෙගුණයක් හෝ

තුන්ගුණයක් වන බව පහත ආයෝජනයන් සැලකීමේදී නිරීක්ෂණය වේ. මෙම ව්‍යාපෘති දේශීය හා විදේශීය අරමුදල් යොදාගෙන කිරීමට අපේක්ෂිතය.

යෝජිත ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව සහ අපේක්ෂිත මුළු ආයෝජනය පහත වගුවේ දැක් වේ.

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති කාලසීමාව | මුළු ආයෝජනය (රු.මිලියන) |
|---|---|---|
| • මොරගහකන්ද හා කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 2007-2012 | 38,000 |
| • ජාතික ජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 2007-2011 | 7,400 |
| • මැණික් ගඟ (වෙහෙරගල) සංවර්ධන ව්‍යාපෘතිය | 2005-2008 | 1,772 |
| • දැදුරු ඔය සංවර්ධන ව්‍යාපෘතිය | 2005-2010 | 6,500 |
| • රඹුක්කන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය | 2006-2009 | 2,500 |
| • උමා ඔය ව්‍යාපෘතිය | 2007-2012 | 15,000 |
| • යාන් ඔය ව්‍යාපෘතිය | 2007-2011 | 8,600 |
| • හැඩඔය ව්‍යාපෘතිය | 2007-2012 | 6,200 |
| • දහසක් මහවැව් වැඩසටහන | 2005-2012 | 9,000 |

# 2. කර්මාන්ත සංවර්ධනය

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

**2006 - 2016**

## ඉදිරි දැක්ම

ඉහළ ආර්ථික වටිනාකමක් සහ ලාභදායිත්වයක් උත්පාදනය කිරිමට අවස්ථා ඇති කිරිම සඳහා ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරී නිෂ්පාදන කර්මාන්තවලට පදනමක් බිහිකිරීම තුළින් රැකියා අවස්ථා පුළුල් කිරීම සහ දරිද්‍රතාවය පිටුදැකීම.

## ප්‍රධාන අරමුණු

### දේශීය ආයෝජන

- විදේශ ආයෝජන දිරිගන්වන අතරතුර දේශීය කර්මාන්තයන්ට සහයෝගය දෙන ප්‍රවේශයක් හඳුන්වාදීම.
- විවිධාංගීකරණය වූ ඉහල අගය එකතු කිරීමක් සහිත කර්මාන්ත පදනමක් ඇති කිරීම.
- දැනුම හා තාක්ෂණය මත පදනම් වූ සහ වඩාත් සඵල ඵලදායීතාවයක් තුළින් කාර්මීකරණයක් සහතික කරලීම.
- සීඝ්‍රයෙන් සංවර්ධනය වන ආර්ථික යටිතල පහසුකම් නිෂ්පාදන ක්‍රියාවලිය සමඟ අනුගත කරලීම.
- කොළඹ, ගම්පහ ආදී නගරවලට සීමාවූ කර්මාන්ත දූර බැහැර පළාත් කරා ව්‍යාප්ත කිරීම.
- ජාතික නවෝත්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ තරඟකාරිත්වය වර්ධනය කිරීම.
- සේවා නියුක්තිය වර්ධනය.

### විදේශීය සෘජු ආයෝජන

- විදේශ ප්‍රාග්ධනය හා තාක්ෂණික පැවරුම් මෙරට කර්මාන්ත ක්ෂේත්‍රය වෙත ආකර්ෂණය කර ගැනීම .
- මෙරට මානව සම්පත නවීන තාක්ෂණික හා කළමණාකාරිත්ව හැකියාවන්ගෙන් සංවර්ධනය කිරීම.
- යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශේෂයන්ම අත්‍යවශ්‍ය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයේ වර්ධනය.
- දැනුම සහ අපනයන පදනම් කරගත් කර්මාන්තයන්හි විවිධාංගීකරණය සහ ව්‍යාප්තිය ඇති කිරීම.
- අගය එකතු කිරීම සහ අපනයන ආදායම ඉහළ නැංවීම තුළින් ආර්ථික වර්ධන වේගය සීඝ්‍ර කිරීම.
- ග්‍රාමීය ජනතාවගේ ආර්ථික තත්වය නගාසිටුවීම.

## උපාය මාර්ග

### දේශීය ආයෝජන

- කර්මාන්තපුර සහ ගමට කර්මාන්ත ආදී යටිතල පහසුකම් සංවර්ධනවැඩසටහන් තුළින් ප්‍රාදේශීය මට්ටමේ ආර්ථික ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම.

- ප්‍රයෝජනයට නොගත් සහ අඩුවෙන් ප්‍රයෝජනයට ගන්නා සම්පත් උපයෝජනය ඉහළ නැංවීම.
- ධාරිතා සංවර්ධනය (Capacity Building) තුළින් ව්‍යවසායකත්ව සංවර්ධනය.
- රාජ්‍ය - පෞද්ගලික හවුල් ව්‍යාපාර දිරිමත් කරවීම.
- කාර්මික නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය සහ නිෂ්පාදන ක්‍රියාවලින්හි ඵලදායිත්වය ඉහළ නැංවීම
- පෙරවැඩුම් මධ්‍යස්ථාන හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා බලයලත් අධිකාරියක් පිහිටුවීම
- ජාතික නවෝත්පාදන පද්ධතිය බල ගැන්වීම සහ කර්මාන්ත අතර ඇති තරඟකාරිත්වය ඉහල නැංවීම
- ව්‍යවසායකත්ව හා ව්‍යාපාර සංවර්ධන සේවා ව්‍යාප්ත කරලීම
- භූගෝලීය කර්මාන්ත පර්ෂද ක්‍රමය ප්‍රවර්ධනය කරලීම

## විදේශීය සෘජු ආයෝජන

- අපනයන සැකසුම් කලාප / විශේෂ ආර්ථික කලාප සහ තාක්ෂණික උද්‍යාන වැනි උසස් තත්වයේ යටිතල පහසුකම් වර්ධනය.
- ව්‍යාප්ත වන ඉන්දියානු වෙළඳපොල සඳහා සැපයුම් සම්පාදනයට අවශ්‍ය හැකියාව විදේශීය ආයෝජකයින් මගින් වර්ධනය කරලීම.
- අපනයන අරමුණු කරගත් විදේශ ආයෝජකයින් සඳහා මෙරටට ඇතුල්වීම සහ සැළසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- දැනුම මත පදනම් වූ කර්මාන්ත බිහිකරලීම සඳහා වැඩි අවස්ථා සැපයීම.
- කාර්මීකරණය සඳහා අවශ්‍ය පරිගණක තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාව පිලිබඳ පරිණත මානව සම්පතක් බිහිකිරීම.
- ආයෝජන ප්‍රවර්ධනය සඳහා ප්‍රමබතා හඳුන්වා දීම.
- රාජ්‍ය හා දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ හවුල්කාරිත්වය ප්‍රවර්ධන කිරීම.

## අපේක්ෂිත තත්වය

- ඉහළ කර්මාන්ත සංවර්ධනයක් තුළින් දළ දේශීය නිෂ්පාදිතයට 34% ක දායකත්වයක් සැපයීම.
- ශක්තිමත් නවෝත්පාදක පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ඉන්දීය, පකිස්ථාන හා චීන ආදී විදේශීය වෙළඳපලේ අවශ්‍යතාවයන් සපුරාලීමට දේශීය හා විදේශීය ආයෝජන මත පදනම් වූ ශ්‍රී ලාංකීය ව්‍යවසාය ජාලයක් බිහිකිරීම.
- දැනුම හා තාක්ෂණය මත පදනම් වූ කාර්මීකරණයක්.
- බල ශක්ති සංරක්ෂණය හා පරිසර හිතකාමී කාර්මීකරණයක්.

| නිර්ණායක | 2006 | 2010 | 2016 |
|---|---|---|---|
| දළදදේශීය නිෂ්පාදිතයට දායකත්වය | 28 | 32 | 34 |
| කර්මාන්ත වර්ධනය | 7.5 | 8.6 | 10.5 |
| කර්මාන්ත පුර (සංඛ්‍යාව) | 17 | 30 | 45 |
| අපනයන සැකසුම් කලාප (සංඛ්‍යාව) | 12 | 19 | 26 |
| සේවා නියුක්තිය (සංඛ්‍යාව ' 000) | 1,850 | 2,100 | 3,300 |
| අපනයන වටිනාකම (එ.ජ. ඩො. මි.) | 4,694 | 8,143 | 20,990 |
| සෘජු විදේශ ආයෝජන (එ.ජ. ඩො. මි.) | 760 | 2,421 | 4,391 |

## ප්‍රධාන ව්‍යාපෘති

- ත්‍රිකුණාමලය අපනයන සැකසුම් කලාපය - (2008-2009)- අපේක්ෂිත මුළු ආයෝජනය රු.මි. 10,080 කි.
- පුත්තලම රසායනික කර්මාන්ත ආර්ථික වෙළඳ කලාපය - අපේක්ෂිත මුළු ආයෝජනය රු:මි. 896 කි.
- කුඩා හා ක්ෂුද්‍ර කර්මාන්ත නායකත්ව හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන ව්‍යාපෘතිය -(2008-2009)- අපේක්ෂිත මුළු ආයෝජනය රු.මි. 8,850 කි.
- පරිසර හිතකාමී විසඳුම් අරමුදල - (2008-2009) - අපේක්ෂිත මුළු ආයෝජනය රු.මි. 4,817 කි.
- ගමට කර්මාන්ත වැඩසටහන - 2007-2010- අපේක්ෂිත මුළු ආයෝජනය රු.මි. 820 ක් පමණ (වාර්ෂික වැඩසටහනකි)
- ප්‍රාදේශීය කර්මාන්තපුර වැඩසටහන - (2008-2011) කාල සීමාව දක්වා අපේක්ෂිත මුළු ආයෝජනය රු.මි. 1753 කි.

# 3. ආර්ථික යටිතල පහසුකම්

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
**2006 - 2016**

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා රට මෙහෙයවීම පිණිස ආර්ථික යටිතල පහසුකම් අංශය දියුණු කිරීම අනිවාර්ය සාධකයකි. මෙමගින් විදුලිබලය, මාර්ග, පානීය ජලසම්පාදනය, සන්නිවේදනය, ප්‍රවාහනය, වරාය හා ගුවන් සේවා හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදු වනු ඇත. යෝජිත යටිතල පහසුකම් සංවර්ධනය තුළින් බලාපොරොත්තු වන මූලික අරමුණ වන්නේ රටේ ජනතාවට එම පහසුකම් වඩා විධිමත්, කාර්යක්ෂම සහ විශ්වාසනීය ලෙස ලබා දීමට කටයුතු කිරීමත් මෙම පහසුකම් සැපයීම තුළින් කර්මාන්ත සහ සේවා අංශ සඳහා ආයෝජන දිරිමත් කිරීමට කටයුතු කිරීමත්ය.

## අපේක්ෂිත ඉලක්ක

ප්‍රධාන ආර්ථික යටිතල පහසුකම් ක්ෂේත්‍ර කිහිපයකට අදාල දර්ශක හා ඉලක්ක පහත් දැක්වේ

| දර්ශකය | ඉලක්කය | | |
|---|---|---|---|
| | 2006 | 2010 | 2016 |
| විදුලිබලය සැපයීම (මුළු පවුල් ඒකක ගණන ප්‍රතිශතයක් ලෙස) | 77 | 86 | 95 |
| පුද්ගලයින් 100 ක් සඳහා ස්ථාවර දුරකථන ප්‍රමාණය | 7.5 | 11.8 | 18 |
| දියුණු ජලසම්පාදන සේවාවලට ප්‍රවේශවීමේ හැකියාව වැඩිකිරීම (ජනගහනයේ ප්‍රතිශතය) | 74 | 85 | 90 |
| හොඳ තත්ත්වයෙන් යුත් මාර්ග කි.මී. ගණන ප්‍රතිශතයක් ලෙස | 40 | 58 | 95 |
| පොදු ප්‍රවාහනයේ වෙළෙඳපොල පංගුව ප්‍රතිශතයක් ලෙස | 69 | 75 | 80 |
| දුම්රිය ප්‍රවාහනයේ වෙළෙඳපොල පංගුව ප්‍රතිශතයක් ලෙස | 06 | 10 | 15 |
| කොළඹ වරායේ ධාරිතාවය වර්ධනය කිරීම (TEUs මිලියන) | 3.3 | 5.7 | 8.1 |

### විදුලිබල හා බලශක්ති උපාය මාර්ග

- විදුලිබල සේවා හෝ භූමිතෙල් යොදා ගනිමින් නිවාස ආලෝකකරණය සිදු කරන අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහනාධාර සැපයීම.
- වසර 2016 වන විට රටේ සමස්ත ගෘහමූලිකයින්ගෙන් 96%කට විදුලිබලය ලබා දීම සඳහා විදුලිබල පද්ධතිය පුළුල් කිරීම පිණිස ජාතික විදුලිබල පද්ධතියෙන් හා ඉන් බැහැර විදුලි සේවා ඇති කිරීමට මුදල් ආයෝජනය කිරීම.

- වඩා ඵලදායී හා කාර්යක්ෂම විදුලිබල සේවාවක් ජනතාවට ලබා දීම සඳහා රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව විදුලිබල ක්ෂේත්‍රයේ සිදු කල යුතු ප්‍රතිසංස්කරණ සිදු කිරීම.

- දැනට විදුලිබල මණ්ඩලයට අයත් ණය පියවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ක්‍රියාත්මක කිරීම. ජාතික විදුලිබල පද්ධතියට අවශ්‍ය 90% ක් පමණ විදුලිබල ප්‍රමාණය ඛනිජ තෙල් නොවන ඉන්ධන භාවිතා කිරීම මගින් උත්පාදනය කිරීමට හැකි වන පරිදි ගල් අඟුරු තාප විදුලි බලාගාර සහ දැනට ඉතිරිව ඇති විශාල /මධ්‍යම ප්‍රමාණයේ ජලවිදුලි බලාගාර ඉදිකිරීම.

- පුනර්ජනනීය විදුලිබල නිෂ්පාදනයට පවතින තාක්ෂණික හා මූල්‍යමය බාධා ඉවත් කිරීම සහ නිෂ්පාදකයින් සඳහා තාක්ෂණය පදනම් කර ගත් සුවිශේෂී ගාස්තු ක්‍රමයක් හඳුන්වා දීම.

- තත්ත්වයෙන් උසස් හා විශ්වාසනීය විදුලිබල සේවාවන් ලබා දීම සඳහා සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලය පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම පිණිස මුදල් ආයෝජනය කිරීම.

- දැනට ජාතික විදුලිබල පද්ධතියෙන් සිදුවන විදුලිබල හානිය අවම කිරීම සඳහා එවැනි හානි සිදුවන සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ ජාලයේ කොටස් වැඩි දියුණු කිරීම හා අලුතින් ඉදි කිරීම වේගවත් කිරීම හා නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම මගින් නිෂ්පාදනයෙන් පසුව හානි වන විදුලිය අවම කර ගැනීම.

- බලශක්ති සංරක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීම තුලින් විදුලිය පිරිමැස්මට පාරිභෝගිකයින් පෙළඹවීම.

- බලශක්ති ක්ෂේත්‍රය හා සම්බන්ධ පර්යේෂණ හා විශ්ලේෂණ කටයුතු ශක්තිමත් කිරීම සහ බලශක්ති සැලසුම්කරණ ක්‍රියාවලිය විධිමත් කිරීම.

## ප්‍රධාන ව්‍යාපෘති

- පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය
- ත්‍රිකුණාමලය ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය
- ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය පියවර 8
- ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය පියවර 9
- ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය පියවර 10
- ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය පියවර 11
- ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතිය පියවර 12
- ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා පුනර්ජනනීය විදුලිබලය පිළිබඳ ව්‍යාපෘතිය
- විදුලිබල ක්ෂේත්‍රයේ චිරස්ථායි සංවර්ධනය
- බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලිබල ව්‍යාපෘතිය
- උමා ඔය ජලවිදුලිබල ව්‍යාපෘතිය
- මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතිය
- කෙරවලපිටිය චක්‍රීය විදුලිබල ව්‍යාපෘතිය
- ඉන්දු-ලංකා විදුලිබල සැපයුම් සම්බන්ධතාවය පිළිබඳ ව්‍යාපෘතිය
- පද්ධති හානි අවම කිරීමේ ව්‍යාපෘතිය
- විදුලමු ශ්‍රී ලංකා ව්‍යාපෘති

## විදුලි සංදේශ

## උපාය මාර්ග

- විදුලි සංදේශ අංශයේ ආයෝජනය පෞද්ගලික අංශය විසින් සිදු කරනු ලබයි. එම නිසා තරගකාරී ලෙස මෙම අංශය පවත්වා ගැනීම සඳහා සියලුම දුරකථන සපයන්නන් සඳහා සමාන අවස්ථා ලබා දීම ධෛර්යමත් කිරීම.
- පාරිභෝගිකයින්ගේ මෙන්ම ආයෝජකයින්ගේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි දුරකථන ගාස්තු සැකසීම කළයුතු අතර පාරදෘශ්‍ය ක්‍රියාමාර්ගයක් මගින් වාර්ෂිකව දුරකථන ගාසතු ප්‍රතිශෝධනය කිරීම.
- විදුලි සංදේශ අංශයෙහි මානව සම්පත් සංවර්ධනයට සුදුසු ආයතන ඇති කිරීම.

**පානීය ජල සැපයුම හා සනීපාරක්ෂාව**

## උපාය මාර්ග

- සම්පූර්ණ ජල ගාස්තුව ගෙවීමට නොහැකි අයගේ අවශ්‍යතාවයන් සපුරාලමින් පිරිවැය ආවරණය වන ගාස්තු ක්‍රමයක් හඳුන්වා දීම.
- ග්‍රාමීය ජලසම්පාදන ව්‍යාපෘතීන් හඳුනාගැනීම, සැකසීම හා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් ජල පාරිභෝගිකයින් විසින් සිදුකිරීමේ ක්‍රමවේද ධෛර්යමත් කිරීම.
- සංයුක්ත නගර සංවර්ධනයේ දී ඒ සඳහා වෙන් වූ ජල සැපයුම් මාර්ග ඇති කිරීම දිරි ගැන්වීම.
- තිරසාර ජල පරිභෝජන පුරුදු කරා යන ඉල්ලුම පාලන වැඩපිළිවෙලක් තුළින් පිරිසිදු ජලය සඳහා ගෘහස්තව පවතින අධික ජල පරිභෝජනය අඩුකර අලුත් ප්‍රතිලාභීන්ට ජල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.

## ප්‍රධාන ව්‍යාපෘති

- කළුගඟ ජලසම්පාදන ව්‍යාපෘතිය
- මහනුවර නගර ආශ්‍රිත ජල සම්පාදන ව්‍යාපෘතිය
- කිරිදිඔය ජලසම්පාදන ව්‍යාපෘති
- යාපනය ජලසම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
- ද්විතීය නගර ප්‍රජා මූලික ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
- මහනුවර මහ නගරසභා ප්‍රදේශය සඳහා වන මලපවහන පද්ධතිය
- කොළඹින් උතුර ග්‍රාමීය ප්‍රදේශ සඳහා වූ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
- කොළඹ,කොළොන්නාව,දෙහිවල හා ගල්කිස්ස ප්‍රදේශ වල දැනට පවත්නා මලපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම
- කුඩා නගර හා ග්‍රාමීය ප්‍රදේශ සඳහා වූ ජල සම්පාදන ව්‍යාපෘතිය
- මාකඳුර, පන්නල හා කුලියාපිටිය ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය
- දංකොටුව ජල සම්පාදන යෝජනා ක්‍රමය
- රුහුණුපුර ජලසම්පාදන ව්‍යාපෘතිය

## මාර්ග සංවර්ධනය

## උපාය මාර්ග

- දැනට පවතින මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීමට හා නඩත්තු කිරීමට ප්‍රමුඛතාවය දෙන අතර පදිකයින්ගේ ආරක්ෂාව කෙරෙහි අවධානය යොමු කිරීම.
- වඩා සැලකිලිමත් ලෙස ආර්ථික තත්ත්වයට ගැළපෙන නව මහාමාර්ග හා අධිවේගී මාර්ග ඉදි කිරීම.

- අධිවේගී, අන්තර් පළාත්, ජාතික, පළාත් සහ ග්‍රාමීය යන අංශවලට අදාළ මාර්ග ඉදි කිරීම, පුනරුත්ථාපන හා නඩත්තු කටයුතු සිදු කිරීම.

- මාර්ග නඩත්තු අරමුදලේ අත්‍යවශ්‍ය මාර්ග නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා මුදල් තිබේ නම් එම අතිරික්ත මුදල් මාර්ග පුනරුත්ථාපනය කිරීම හෝ මාර්ග පුළුල් කිරීමට හා වැඩිදියුණු කිරීමට යොදා ගැනීම.

- දැනට ප්‍රවේශ මාර්ග පහසුකම් රහිතව පවතින රටේ මුළු ගම් සංඛ්‍යාවෙන් 6% ක් වූ ගම්මාන සංඛ්‍යාව සඳහා මාර්ග පහසුකම් සලසා දීමට ප්‍රමුඛතාවක් දීම.

- ප්‍රවාහන කළමනාකරණය හා මාර්ග භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව පිළිබඳ වැඩසටහනක් ආරම්භ කිරීම.

- ප්‍රවාහන කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස මාර්ග භාවිතය සඳහා මුදල් අය කිරීම, ගුවන් පාලම් ඉදි කිරීම, විදුලි සංඥා ක්‍රම ඇති කිරීම හා තල කිහිපයකින් යුත් ගුවන් පාලම් ඉදි කිරීමට ක්‍රියා කිරීම.

- මාර්ග ක්ෂේත්‍රයට අදාළ ආයතන තුළ ප්‍රතිසංස්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- රාජ්‍ය-පුද්ගලික හවුල් ව්‍යාපාර මගින් අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා ඇති ආයෝජන අවස්ථා විවෘත කිරීම.

- උපයෝගිතා පහසුකම් (ජලනළ, දුරකථන මාර්ග ආදිය දැමීම මගින්) ඇති කිරීමේ දී මාර්ග වල මතුපිටට ඇති කරන හානි අවම කිරීමට ක්‍රමවේදයක් ඇති කිරීම.

- ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය සඳහා වූ "මග නැගුම" විශේෂ වැඩසටහන නොකඩවා ක්‍රියාත්මක කිරීම.

- ජාතික දිළිඳුකම පිටුදැකීමේ උත්සාහය සඳහා මාර්ග සංවර්ධන ක්ෂේත්‍රයේ සහාය ලබා දීම.

## ප්‍රධාන ව්‍යාපෘති

### අධිවේගී මාර්ග

- දක්ෂිණ අධිවේගී මාර්ගය
- කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය
- කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය
- කොළඹ - යාපනය අධිවේගී මාර්ගය

### මහාමාර්ග

- පිටත වටරවුම් මාර්ගය (කොට්ටාව සිට කෙරවලපිටිය දක්වා)
- පුත්තලම - ත්‍රිකුණාමලය මාර්ගය පුනරුත්ථාපනය කිරීම
- කටුනායක - පාදෙනිය මාර්ගය
- පාදෙනිය - අනුරාධපුරය මාර්ගය
- අඹේපුස්ස - කුරුණෑගල - හබරණ - ත්‍රිකුණාමලය මාර්ගය
- පුත්තලම - ත්‍රිකුණාමල මාර්ගය
- මහනුවර - මහියංගනය මාර්ගය
- නුවරඑළිය - බදුල්ල මාර්ගය

- බද්දල්ල - වෙන්කලාඩි මාර්ගය
- හම්බන්තොට - තණමල්විල - වැල්ලවාය - මොණරාගල - සියඹලාණ්ඩුව - අම්පාර - කරතිව් මාර්ගය
- මාතර - හම්බන්තොට මාර්ගය
- සුනාමි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
- ගුවන් පාලම් ඉදි කිරීමේ ව්‍යාපෘතිය
- මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන
- වතු ආශ්‍රිත මාර්ග සංවර්ධන වැඩසටහන

## බස් ප්‍රවාහනය

### උපාය මාර්ග

- නිවැරදි පුනරුත්ථාපන වැඩසටහන් හඳුන්වා දීම තුළින් දැනට තිබෙන ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික සබඳතාව තුළින් නාගරික ප්‍රදේශ සඳහා නිවැරදි බහු මගී ප්‍රවාහන ක්‍රමය හඳුන්වා දීමෙන් වාහන තදබදය අවම කිරීම.
- නව බස් රථ යෙදවීමෙන්, ධාවනයෙන් ඉවත් කොට ඇති බස් රථ පුනරුත්ථාපනය කිරීමෙන් හා නව එන්ජින් යොදා අලුත්වැඩියා කිරීම තුළින් රාජ්‍ය බස් සේවය ශක්තිමත් කිරීම.
- පැරණි බස් රථ වෙනුවට නව බස් රථ යෙදවීමට පෞද්ගලික අංශය දිරිමත් කරලීම.

### ප්‍රධාන ව්‍යාපෘති

- භාවිතයට නුසුදුසු බස් රථ වෙනුවට නව බස් රථ 10,000ක් මිලදී ගැනීම.
- යෝජිත කඩිනම් බස් ප්‍රවාහන ක්‍රමය බත්තරමුල්ල හා දෙමටගොඩ අතර ක්‍රියාත්මක කිරීම.
- ආදර්ශ ඩිපෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හරහා තෝරාගත් ඩිපෝ සඳහා භෞතික හා මානව සම්පත් සම්පූර්ණ කිරීම තුළින් ජනතාවට යහපත් ප්‍රවාහන සේවයක් සැපයීම.
- ධාවනයෙන් ඉවත් කර ඇති බස් රථ සඳහා නව එන්ජින් සවිකර ධාවනයට එකතු කිරීම.

## දුම්රිය ප්‍රවාහනය

### උපාය මාර්ග

- මාර්ග ඔස්සේ සිදු කරන භාණ්ඩ ප්‍රවාහනය, දුම්රියෙන් ප්‍රවාහනය කිරීමට යොමු කරමින් භාණ්ඩ ප්‍රවාහනයේ දී සිදුවන වියදම අඩු කිරීම හා දුම්රිය සේවාවන් ලබන ආදායම වැඩිකිරීම.
- මගීන්ට ලබා දෙන දුම්රිය සේවාවන් වැඩි දියුණු කිරීම.
- කාර්යක්ෂම කළමනාකරණ ක්‍රමයන් හඳුන්වා දෙමින් වැඩිවන මෙහෙයුම් හා මූල්‍ය පාඩු කළමනාකරණය කිරීම.
- නව දුම්රිය මාර්ග ඉදි කිරීම, බහාලුම් ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම හා නූතන තාක්ෂණය හා වඩා හොඳ කළමනාකරණ ක්‍රමයන් හඳුන්වා දීම තුළින් දුම්රිය සේවය නවීකරණය කිරීම.

## ප්‍රධාන ව්‍යාපෘති

- වෙරළබඩ දුම්රිය මාර්ගය කතරගම ක්වා ර්ස කිරීම.
- කොළඹ - මාතර දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස වැඩිදියුණු කිරීම.
- නව දුම්රිය මැදිරි 100 ක්, එන්ජින් 15 ක් හා බලවේග කට්ටල 15 ක් දුම්රිය සේවයට අලුතින් එකතු කිරීම.
- නව දුම්රිය මාර්ග ඉදිකිරීම. (පානදුර සිට හොරණ, කුරුණෑගල සිට හබරණ හරහා දඹුල්ල)

### වරාය සංවර්ධනය

## උපාය මාර්ග

- පවත්නා වරායන්වල ධාරිතාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම.
- විශාල ප්‍රමාණයෙන් යුත් නවීන බහාලුම් සහිත නැව් නැවැත්වීම සඳහා කොළඹ වරායේ ධාරිතාවය හා දිය ගැඹුර වැඩි කිරීම.
- ගාල්ල හා ඔලුවිල් වැනි ප්‍රාදේශීය වරායයන් සංවර්ධනය කිරීම මගින් කොළඹ වරායේ පවතින නාවික තදබදය අඩු කිරීම.
- කාර්මික හා සේවා සපයන වරායක් ලෙස හම්බන්තොට වරාය සංවර්ධනය කිරීම.

## ප්‍රධාන ව්‍යාපෘති

- කොළඹ වරාය පුළුල් කිරීම.
- ගාලු වරාය සංවර්ධනය කිරීම.
- හම්බන්තොට වරාය ඉදි කිරීම.
- ඔලුවිල් වරාය සංවර්ධනය කිරීම.

### ගුවන් සේවා

## උපාය මාර්ග

- බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළෙහි යටිතල පහසුකම් වර්ධනය කිරීම, ගුවන් බඩු හා මගී ප්‍රවාහනය පාලනය, සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව වර්ධනය කිරීම.
- නව ගුවන් තොටුපළවල් හා පවත්නා ගුවන් තොටුපළවල් සංවර්ධනය කිරීම තුළින් ලාභදායී මිලකට අන්තර්ජාතික වශයෙන් ගුවන් භාණ්ඩ හා මගී ප්‍රවාහන සේවාවන් සැපයීමට කටයුතු කිරීම.
- සහනදායී මිලකට අන්තර්ජාතික ගුවන් සේවාවන් සැපයීම සඳහා දේශීය ගුවන් සේවාවන් ධෛර්යමත් කිරීම.

## තැපැල් සේවාව

## උපාය මාර්ග

- සෑම ජනසභා ලේකම් කාර්යාලයක් තුළට තැපැල් කාර්යාල ඉදිකිරීම තුළින් කාර්යක්ෂම තැපැල් සේවාවක් ලබා දීම.
- නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර පවතින සන්නිවේදන අසමානතා අඩු කිරීම සඳහා තැපැල් කාර්යාල සන්නිවේදන මධ්‍යස්ථාන බවට පත් කිරීම.
- තැපැල් සේවය සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීම තුළින් කාර්යක්ෂම සේවයක් ඇති කිරීම.
- විද්‍යුත් මුදල් හුවමාරු, රක්ෂණ ගාස්තු ගෙවීම්, බැංකු සේවා සහ විද්‍යුත් රාජ්‍ය සේවා පහසුකම් ලබා දීම තුළින් අමතර ආදායම් ලබා ගැනීම.

# 4. සංචාරක කර්මාන්තය

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

2006 - 2016

## ඉදිරි දැක්ම

දකුණු ආසියානු කලාපය තුළ ප්‍රධානතම සංචාරක දේශාන්තය බවට ශ්‍රීලංකාව පත්කිරීම.

## ප්‍රධාන අරමුණු

- ආර්ථිකය තුළ තෙවන විශාලතම විදේශ විනිමය උපයන්නා බවට සංචාරක කර්මාන්තය පරිවර්තනය කිරීම.
- සංචාරක කර්මාන්තය වේගවත්ම රැකියා උත්පාදකයා බවට පත්කිරීම.
- සංචාරක නිමැවුම් මගින් ඉහළ ස්තර සංචාරක වෙළෙඳපොළ ආකර්ෂණය කරගැනීම.

## ඉලක්ක

| නිර්නායක | 2006 | 2010 | 2016 |
|---|---|---|---|
| සංචාරක පැමිණීම (000') | 560 | 1500 | 2000 |
| හෝටල් කාමර | 14,218 | 25,000 | 35,000 |
| රැඳි සිටීමේ කාලසීමාවේ සාමාන්‍යය (දින) | 10.4 | 10 | 12 |
| වියදම් කරනු ලබන ප්‍රමාණයෙහි සාමාන්‍යය (දිනකට ඇමරිකන් ඩොලර්) | 83 | 200 | 250 |
| සෘජු හා වක්‍ර රැකියා අවස්ථා (000.) | 130 | 350 | 500 |
| ඉපැයීම් (ඇමරිකන් ඩොලර් මිලියන) | 410 | 800 | 1200 |

## උපාය මාර්ග

- ශ්‍රී ලංකාව, සංචාරක කර්මාන්තයේ කලාපීය කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම.
- මද්දුව, ගාල්ල, පානම, මීගමුව, ආරුගම්බේ, හම්බන්තොට, නිලාවැලි සහ කල්පිටිය යන ස්ථාන සංචාරක කලාපයන් ලෙස සංවර්ධනය කිරීම.
- හෝටල් කාමර 35,000 ක ධාරිතාවය සපුරා ගැනීමටත්, හෝටල් ක්ෂේත්‍රයේ ආයෝජන උනන්දු කරවීම සඳහාත්, නූතන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- සංචාරකයන් අතර කොළඹ නගරය ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කරලීම.

## ප්‍රධාන ව්‍යාපෘති

- සංචාරක සම්පත් ප්‍රවර්ධන ව්‍යාපෘතිය (2006-2011) - අපේක්ෂිත මුළු පිරිවැය රු.මි. 2917.
- කල්පිටිය සංචාරක නිකේතන ව්‍යාපාතිය (2007-2010) - අපේක්ෂිත මුළු පිරිවැය රු.මි. 15,000.
- නිලාවැලි, ආරුගම්බේ සහ පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපාතිය (2008-2012) - අපේක්ෂිත මුළු පිරිවැය රු.මි. 7,000.

# 5. නාගරික සංවර්ධනය හා නිවාස

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

**2006 - 2016**

## ඉදිරි දැක්ම

සියලුම පුරවැසියනට සුව පහසු, අභිමානවත් හා සෞඛ්‍යාමය සම්පන්න පරිසරයක ජීවත් වීම සහතික කෙරෙන නාගරික හා මානව ජනාවාස සංවර්ධන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.

## ප්‍රධාන අරමුණු

### නාගරික සංවර්ධනය

- ක්‍රමවත් නගර සංවර්ධන වැඩ සටහන් තුළින් නාගරික ප්‍රදේශ කරා සිදුවන සංක්‍රමණ මඟින් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කරලීම.
- නාගරික සංවර්ධනය ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියෙහි යාන්ත්‍රණය බවට පත් කිරීම.
- සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතා අවම කිරීම.

### නිවාස

- වෙනස් වන ජීවන රටාවන් සැලකිල්ලට ගනිමින් තිරසාර මානව ජනාවාස සංවර්ධනයක් සහතික කිරීම.
- සියලුම පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් නිවාස සංවර්ධන වැඩ සටහන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම.
- ශක්තිමත් නිවාස මූල්‍ය වෙළෙඳපොළක් ස්ථාපිත කිරීම.

## උපාය මාර්ග

### නාගරික සංවර්ධනය

- භූගෝලීය වශයෙන් තුලනාත්මක සංවර්ධනයක් සහතික කිරීමසඳහා ජාතික මට්ටමේ නාගරික වර්ධන කේන්ද්‍ර ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලිය පණගැන්වීම අරමුණු කොට ගෙන යෝග්‍ය තේමාවන් අනුව ප්‍රාදේශීය නගර වර්ධන මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම.
- කොළඹ හා අනෙකුත් ප්‍රධාන නගරවල ඇති ඌන සේවා ජනාවාස ක්‍රමවත් අයුරින් සංවර්ධනය කරලීම.
- නව නීති රෙගුලාසි හඳුන්වාදීම සහ පවත්නා රෙගුලාසි මැනෙවින් ක්‍රියාත්මක කිරීම.

### නිවාස

- එක් එක් දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි භෞතික සැලසුම් සැලකිල්ලට ගනිමින් නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ප්‍රදේශ තෝරා ගෙන අවශ්‍ය පහසුකම් සැපයීම .
- අඩු ආදායම් ලාභීන් හා වෙනත් පීඩාවට පත් පුද්ගල කණ්ඩායම් සඳහා නිවාස සැපයීමේදී ස්වයං උපකාරී ක්‍රමය දිරිමත් කිරීම (ප්‍රදාන හා ණය).
- මධ්‍යම පාන්තික පවුල් සඳහා පහසු නිවාස ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම.
- පෞද්ගලික සංවර්ධකයින් දිරිමත් කිරීම තුළින් නිවාස ප්‍රමාණය ඉහළ නැංවීම.

## අපේක්ෂිත ඉලක්ක

| නිර්ණායක | 2006 | 2010 | 2016 |
|---|---|---|---|
| ජාතික මට්ටමේ මහ නගර ස්ථාපිත කිරීම | - | 1 | 3 |
| නව ද්විතීයික නගර සංවර්ධනය කිරීම. | - | 8 | 12 |
| සියළු පහසුකම් සහිත නිවාස ඇති ජනගහනය (%) | 60 | 75 | 100 |
| සනීපාරක්ෂක පහසුකම් සහිත ජනගහනය (%) | 73 | 80 | 100 |

## අපේක්ෂිත ප්‍රතිඵල

- ප්‍රාදේශීය වර්ධන කේන්ද්‍ර වශයෙන් වැදගත් වන මහ නගර සංවර්ධනය
- නවීන පහසුකම්වලින් සමන්විත ආකර්ෂණීය ප්‍රාදේශීය නගර
- පැල්පත් වලින් තොර අලංකාර නගර
- සැම පවුලක් සඳහාම සියලු පහසුකම් සහිත නිවාසයක්
- වෙනස් වන ජීවන රටාවන්ට ගැළපෙන සැලසුම් සහගත ජනාවාස

## ධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ආයෝජනය (රු. මිලියන) |
|---|---|
| • හම්බන්තොට ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය හා පරිපාලන සංකීර්ණය (2007-2010) | 4,657 |
| • මහ ත්‍රිකුණාමලය සංවර්ධනය (පළමු අදියර) ((2008-2012) | 18,000 |
| • මහ දඹුල්ල සංවර්ධනය (2006-2016) | 39,000 |
| • පංචිකාවත්ත ත්‍රිකෝණ සංවර්ධනය (2007-2016) | 30,000 |
| • සුනාමියෙන් හානිවූ නිවාස යළි ඉදිකිරීම - පුත්තලම (2006-2008) | 48,000 |
| • රණවිරු ගම්මානය - ඉපලෝගම (2007-2009) | 2,268 |
| • අවතැන්වූ පුද්ගලයින් සඳහා වූ නිවාස වැඩසටහන (2007-2009) | 3,500 |
| • නාගරික ඌන සේවා ජනාවාසවල වෙසෙන පවුල් සඳහා නිවාස වැඩසටහන (පැලිත් මන්දිර) (2008-2010) | 4,443 |
| • වතු අංශයේ ශ්‍රමිකයින් සඳහා නිවාස 50,000 වැඩසටහන (2007-2015) | 18,000 |

# 6. ජීවනෝපාය සංවර්ධනය සහ සමාජ ආරක්ෂණය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
**2006 - 2016**

## ඉදිරි දැක්ම

ගම කේන්ද්‍ර කොට ගෙන ජනතාවගේ විශේෂයෙන්ම අඩු වරප්‍රසාදලාභී ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සහ ඔවුන් රටේ සංවර්ධන ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් බවට පත්කිරීම.

## ප්‍රධාන අරමුණු

### ජීවනෝපාය සංවර්ධනය

- දරිද්‍රතාවයේ ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම.
- දිළිඳු ජනතාව සඳහා ස්ථිරසාර ආදායම් උත්පාදන සහ රැකියා අවස්ථා ලබා දීම තුළින් දරිද්‍රතාවය අඩු කිරීම.
- දිළිඳු ප්‍රජාවගේ යැපුම් මානසිකත්වය දුරලීම.

### සමාජ ආරක්ෂණය

- අඩු වරප්‍රසාදලාභී ජන කොටස් සඳහා සමාජ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කිරීම.
- සියලු අඩු වරප්‍රසාදලාභී ජන කණ්ඩායම් සංවර්ධන ක්‍රියාදාමයේ සක්‍රීය කොටස්-කරුවන් බවට පත් කිරීම.
- අඩු වරප්‍රසාදලාභී ජන කණ්ඩායම්වල ස්වඅභිමානය ඉහළ නැංවීම.

### ආපදා කළමනාකරණය

- ස්වාභාවික ආපදාවන්ගෙන් සිදුවිය හැකි බලපෑම සහ හානිය අවම කිරීම.
- ආපදා තත්ත්වයකදී සියලු පුරවැසියන්ගේ උපරිම ආරක්ෂාව තහවුරුකිරීම සහ දේපල සහ යටිතල පහසුකම් ආරක්ෂා කිරීම.
- ආපදාවලට ලක්වූවන් සඳහා කඩිනමින් ආධාර උපකාර කිරීම.

## අපේක්ෂිත ඉලක්ක

| නිර්ණායකය | 2006 | 2010 | 2016 |
|---|---|---|---|
| මානව සංවර්ධන දර්ශකය | 0.77 | 0.8 | 0.9 |
| දරිද්‍රතා අනුපාතය | 23 | 18 | 12 |
| අවුරුදු පහට අඩු නියමිත බර නොමැති ළමුන් සංඛ්‍යාව (1000 කට) | 25 | 21 | 19 |
| ගිනි සංගුණකය | 0.45 | 0.4 | 0.3 |
| අවුරුදු 15 ත් 24 ත් අතර සේවා වියුක්ති අනුපාතය | 20 | 15 | 09 |

## උපාය මාර්ග

### ජීවනෝපාය සංවර්ධනය

- ග්‍රාමීය මට්ටමේ යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් ස්වයං රැකියා අවස්ථා සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.
- ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට ප්‍රවේශයක් වශයෙන් සහනදායි පදනමක් මත සුළු ණය සැපයීම.
- වෙළෙඳපොළ සහ තාක්ෂණය පිළිබඳ නව තොරතුරු ලබාදීම.

### සමාජ ආරක්ෂණය

- සමාජයේ අවාසි සහගත පුද්ගලයින් සඳහා සහනාධාර ලබා දීම.
- සමාජයේ අසරණ භාවයට පත් පුද්ගලයින් ආර්ථිකයේ කොටස් කරුවන් බවට පත් කිරීම සඳහා සහය දැක්වීම.
- මෙම ජන කණ්ඩායම්වල අයිතීන් හා සුභසාධනය තහවුරු කරලීම.

### ආපදා කළමනාකරණය

- සිදුවිය හැකි ස්වාභාවික ආපදාවන් පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම.
- අවදානම් සහිත ප්‍රදේශ සඳහා පූර්ව අනතුරු හැඟවීමේ පද්ධතීන් හඳුන්වා දීම.
- හදිසි මෙහෙයුම් හා ආපදා සහන කටයුතු ශක්තිමත් කිරීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

- දිළිඳු බවින් තොර සමෘද්ධිමත් සමාජයක්.
- තිරසාර ආදායම් ප්‍රභවයන් සහිත සමාජයක්.
- ප්‍රාදේශීය සමතුලිත සංවර්ධනයක් සහිත ආර්ථිකයක්.
- සමාජීය වශයෙන් අවාසි සහගත කණ්ඩායම් රැක බලා ගන්නා සමාජයක්.
- ආපදා අවදානම අවම වූ සුරක්ෂිත රටක්

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ආයෝජනය (රු. මිලියන) |
|---|---|
| • ගම නැගුම | 66,000 |
| • ජීවනෝපාය සංවර්ධනය (සමෘද්ධි) | 10,698 |
| • ස්වයං රැකියා සඳහා සුළුපරිමාණ ණය | 41,000 |
| • ගැමිදිරිය (අදියර I) | 6,632 |
| • ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීම | 4,130 |
| • ජාතික සවිය | 6,909 |

# 7. ශ්‍රම සම්පත් සහ රැකියා උත්පාදනය

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

**2006 - 2016**

## ඉදිරි දැක්ම

ගුණාත්මක තත්ත්වයෙන් යුත් තරගකාරී නිෂ්පාදන සඳහා අවශ්‍ය නිපුණතාවය හා විශේෂඥතාවයෙන් යුත් මානව ගෞරවය, ආරක්ෂාව, සමානාත්මතාවය හා නිදහස සහිත වැඩ කිරීමේ පරිසරයක් තුළ ඵලදායි රැකියා අවස්ථාවක් සෑම ශ්‍රමිකයෙකුටම ලබාදීම.

## ප්‍රධාන අරමුණු

- රැකියා උත්පාදනය ඉහළ නැංවීම.
- කුසලතා සංවර්ධනය හා ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම.
- කම්කරු නීති රීති හා පටිපාටිවල නම්‍යතාවය ඉහළ නැංවීම.
- සේවක - සේව්‍ය සබඳතා ශක්තිමත් කිරීම.

## ඉලක්ක

| | 2005 | 2016 |
|---|---|---|
| සේවා වියුක්තිය 2005 පැවති මට්ටමින් අඩක් දක්වා අඩුකිරීම | 8.1 | 3.8 |
| කාන්තා සේවා වියුක්තිය 50%කින් අඩු කිරීම | 11.9 | 5.9 |
| යොවුන් (අවුරුදු 15 - 24) සේවා වියුක්තිය අඩු කිරීම | 22% | 9% |
| වාර්ෂික ශ්‍රම ඵලදායිතාවය ඉහළ නැංවීම | කෘෂි 77.4<br>කර්මාන්ත 152.2<br>සේවා 172.4 | 116<br>228<br>258 |
| ඌන සේවා නියුක්තිය අඩු කිරීම | 23.5 | 11.5 |
| තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම | 10% | 60% |
| කම්කරු ආරවුල් ගණන අඩු කිරීම | 15,000 | 3,750 |
| වැඩ වර්ජන ගණන අඩු කිරීම (මිනිස් පැය) | 158,000 | 38,000 |
| අත්සන් කරන සාමූහික ගිවිසුම් ගණන දෙගුණ කිරීම | 35 | 70 |

## උපාය මාර්ග

- ජාතික රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
- තරුණ පරපුරේ රැකියා ශක්‍යතාවය ඉහළ නැංවීම
- කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන අවස්ථා වැඩි කිරීම
- පුහුණු විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරලීම
- ජාතික ඵලදායිතාව ඉහල නැංවීම
- උපාධිධාරී රැකියා වැඩසටහන නවීන අවශ්‍යතා අනුව සකස් කිරීම

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | පිරිවැය (රු. මිලියන) | අරමුණ |
|---|---|---|
| විගමනිකයන් සඳහා වන විදේශ භාෂා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම | 350 | විගමනිකයන්ගේ විදේශ භාෂා හැකියාව ඉහළ නැංවීම තුළින් ඔවුන්ට සිය සේවා ස්ථාන තුළදී මුහුණදීමට සිදුවන දුෂ්කරතා අවම කිරීම |

# 8. අධ්‍යාපනය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
2006 - 2016

## ඉදිරි දැක්ම

මනා පෞරුෂයකින් හෙබි නිර්මාණශීලි පුද්ගලයකු රටට බිහිකිරීමට හැකිවන සේ බුද්ධි වර්ධනය මෙන්ම සංස්කෘතික අනන්‍යතාවය ද ආරක්ෂා කරමින් සමාජයේ එකිනෙකා හා සාමයෙන් සහ සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම.

## ප්‍රධාන අරමුණු

### පාසල් අධ්‍යාපනය

- සියලුම ළමයින්ට නිදහස් අධ්‍යාපනය ලබාගැනීමේ අයිතිය තහවුරු කිරීම
- මූලික හා ද්විතියික අධ්‍යාපනය ලබා ගැනීමට ඇති අවස්ථාවන් වැඩි කිරීම

### විශ්වවිද්‍යාල හා කාර්මික අධ්‍යාපනය

- දැනුමෙන් සපිරි වර්තමාන සමාජයට ගැළපෙන උපාධිධාරීන් පිරිසක් බිහිකිරීම
- විශ්වවිද්‍යාලවල උපාධි පිරිනැමීමේ ධාරිතාවය ඉහළ නැංවීම
- පාඨමාලා වල ගුණාත්මක බව නැංවීම මඟින් උපාධිධාරීන්හට රැකියා ලබාගැනීමට ඇති හැකියාව වර්ධනය කිරීම.

## ඉලක්ක

### පාසල් අධ්‍යාපනය

| නිර්ණායක | ඒකකය | 2009 | 2016 |
|---|---|---|---|
| පාසල් වලට ඇතුලත්වීම (%) | ප්‍රාථමික අධ්‍යාපනය | 98 | 100 |
| | ද්විතියික අධ්‍යාපනය | 241 | 270 |
| අධ්‍යාපනයේ රඳවා ගැනීම (%) | 5වන පන්තිය දක්වා | 99 | 100 |
| | 10වන පන්තිය දක්වා | 85 | 95 |
| | 12වන පන්තිය දක්වා | 60 | 70 |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාසල් වල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම (%) | ප්‍රාථමික පාසල් | 30 | 100 |
| | ද්විතියික පාසල් | 20 | 100 |
| | ඉසුරු පාසල් | 35 | 100 |
| 12, 13 ශ්‍රේණිවලට විද්‍යා අධ්‍යාපනය ලබා දීම (%) | ද්විතියික පැසැල් | 25 | 100 |

විශ්ව විද්‍යාල හා කාර්මික අධ්‍යාපනය

| නිර්ණායක | 2009 | 2016 |
|---|---|---|
| පූර්ණ කාලීන උපාධි හදාරන දේශිය සිසුන් | 21,500 | 30,000 |
| ඉලෙක්ට්‍රොනික, බාහිර හා විවෘත මාධ්‍යයන්ගෙන් ඉගෙනුම ලබන සිසුන් | 20,000 | 55,000 |
| උපාධි ලබා පිටවන සිසුන් සංඛ්‍යාව | 25,300 | 83,000 |
| උපාධිධාරින්ගේ රැකියා නියුක්ති අනුපාතය වැඩිකිරීම | 60% | 85% |

# උපාය මාර්ග

## පාසල් අධ්‍යාපනය

- රජයේ අනුග්‍රහය ලබන පාසල්වල ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ද්විතියික අධ්‍යාපනය දක්වා පෙළ පොත්, පාසල් නිල ඇඳුම් සහ දිවා ආහාරය නොමිලේ ලබා දීම
- සියලුම සිසුන්ට මව භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම ලබා දීම
- අවිධිමත් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම

## විශ්වවිද්‍යාල හා කාර්මික අධ්‍යාපනය

- විශ්ව විද්‍යාල පද්ධතිය තුල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
- ඉල්ලුමට සරිලන පරිදි උපාධි පාඨමාලා හඳුන්වා දීම.
- වෘත්තිය පුහුණුව සඳහා ප්‍රවේශ මාර්ග ඉහළ නැංවීම.
- අන්තර් සම්බන්ධතාවන් හා සහයෝගිතාව ගොඩනගා ගැනීම හරහා විශ්ව විද්‍යාල හා කර්මාන්ත අංශය අතර හොඳ සම්බන්ධතාවක් ඇති කිරීම.

# ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | පිරිවැය (රු.මිලියන) | අරමුණ |
|---|---|---|
| **පාසල් අධ්‍යාපනය** | | |
| • නවෝද්‍යා පාසල් ව්‍යාපෘතිය | 8,450 | පාසැල් 516 සඳහා යටිතල හා අනෙකුත් පහසුකම් සපයා දීම. |
| • ඉසුරු පාසල් ව්‍යාපෘතිය | 11,550 | තොරතුරු තාක්ෂණය, ඇගයුම් ක්‍රම හා නිපුනතා පාදක ඉගැන්වීමේ ක්‍රියාවලිය පිළිබඳ පූර්වාරම්භක සේවා පුහුණුවක් සහ සේවාස්ථ පුහුණුවක් ලබාදීම සඳහා විද්‍යාපීඨ 18 ක් සහ ගුරු පුහුණු මධ්‍යස්ථාන 10ක් ස්ථාපිත කිරීම. |
| **විශ්ව විද්‍යාල හා කාර්මික අධ්‍යාපනය** | | |
| • දකුණ, නැගෙනහිර සහ උතුරු පළාත්වල උසස් අධ්‍යාපන ආයතන පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය | 1787.5 | විශ්ව විද්‍යාල ගොඩනැගිලි සහ උසස් තාක්ෂණ ආයතන පුනරුත්ථාපනය කිරීම සහ නැවත ගොඩනැගීම |
| • මට්ටක්කුලිය සහ ලබුදූව උසස් තාක්ෂණ ආයතන සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම | 3,713 | නිපුනතාව පාදක කරගත් අධ්‍යාපනයේ විශිෂ්ඨතා මධ්‍යස්ථානය ලෙස පරිවර්තනය කිරීම |
| • කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය | 2,670 | කාර්මික අධ්‍යාපනයේ ගුණත්වය, ප්‍රවේශය, අදාලත්වය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම |
| • අග්නිදිග විශ්ව විද්‍යාලය | 4,200 | සුනාමි ව්‍යසනයෙන් සහ ජනවාර්ගික යුද්ධයෙන් පීඩාවට පත් නැගෙනහිර පළාතේ තෘතීය අධ්‍යාපනය නංවාලීම. |

# 9. සෞඛ්‍යය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
2006 - 2016

## ඉදිරි දැක්ම

දේශීය වශයෙන් ආර්ථික, සාමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම

## අරමුණ

අඩු ආදායම් ලාභීන් හා සමාජයේ වඩාත් අවධානය ලැබිය යුතු කොටස් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් වඩා ගුණාත්මක හා නවීන සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීමට පුරවැසියනට ඇති හැකියාව තහවුරු කරලීම.

## ප්‍රතිපත්ති රාමුව

- පවතින සේවාවල අඩුපාඩු මගහරිමින් ඒවායේ ගුණාත්මක තත්ත්වය හා පරාසය වර්ධනය කිරීම
- සෞඛ්‍ය සේවාවල දැනට ඇති ප්‍රාදේශීය විෂමතා අවම කිරීම.
- සෞඛ්‍ය සේවා ලබාදීම උදෙසා පෞද්ගලික ආයෝජකයන් දිරිගැන්වීම
- දේශීය වෛද්‍ය සේවා නඟා සිටුවීම.

## ප්‍රධාන ඉලක්ක

| ඉලක්කය | පාදක තත්ත්වය 2006 | ඉලක්කය 2009 | ඉලක්කය 2013 | ඉලක්කය 2016 |
|---|---|---|---|---|
| **සෞඛ්‍ය තත්ත්වය** | | | | |
| මාතෘ මරණ අනුපාතය / 100,000 ජීව උපත් | 45 | 42 | 35 | 20 |
| | 118 | 106 | 9 | 7 |
| ළදරු මරණ අනුපාතය / 1000 ජීව උපත් | | | | |
| | 25 | 22 | 18 | 15 |
| බර අඩු පෙර පාසල් ළමුන්ගේ ප්‍රතිශතය | | | | |
| | 16 | 13 | 10 | 8 |
| බර අඩු උපත් ප්‍රතිශතය | | | | |

## උපාය මාර්ග

- සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වැඩි අවධානයක් යොමු කරමින් රෝග වැළැක්වීමේ සේවාවන් නියමිත පරිදි හැඩ ගැස්වීම.
- ප්‍රධාන බෝවන රෝග වඩාත් ඵලදායි ලෙස පාලනය කරනු ලබන අතර හැකි සෑම අවස්ථාවකම ඒවා රටින් තුරන් කිරීමට ක්‍රියා කිරීම.

- බෝනොවන රෝග මට්ටම අවම කිරීම.
- දුර්ලභ ඖෂධ නිෂ්පාදනයන්ට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ආයුර්වේද වෛද්‍යවරුන්ට අවශ්‍ය පහසුකම් සළසා දීම
- ධූම ධූමාල ප්‍රතිකාර හා පංචකර්ම ආදි වූ විශේෂිත දේශීය වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන අලුතින් ඇති කිරීම සඳහා පෞද්ගලික අංශය දිරි ගැන්වීම
- පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන්වල සමතාවය හා කාර්යක්ෂමතාවය නංවාලීම සඳහා අවශ්‍ය පූර්ව ආරක්ෂණ ක්‍රම රජය විසින් අනුගමනය කරන අතර සෞඛ්‍ය සේවා සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය පුළුල් කිරීම.
- රෝග මර්ධන සේවා ග්‍රාමීය දිළිඳු ජනතාව වෙත වඩාත් ප්‍රවිශ්‍ය කිරීම සඳහා හඳුනාගත් පහසුකම් වැඩි දියුණු කිරීම.
- වතු ආශ්‍රිත ජනතාව සහ විශේෂිත ජන කණ්ඩායම් එනම් යෞවනයන් වයස්ගත හා ආසාදිත කොටස් වැනි කොටස් වල අවශ්‍යතා සපුරාලීම සඳහා සේවා ව්‍යාප්ත කිරීම.
- ඵලදායී හා ලබාගත හැකි නව තාක්ෂණික ක්‍රම හා සොයා ගැනීම් සෞඛ්‍ය ක්ෂේත්‍රයට හඳුන්වා දීම.

# ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | පිරිවැය (රු. මිලියන) | අරමුණ |
|---|---|---|
| සේලයින් නිෂ්පාදනාගාරයක් පිහිටුවීම | 1,130 | උසස් තාක්ෂණයෙන් හා උපකරණ වලින් යු... සේලයින් නිෂ්පාදනාගාරයක් පිහිටුවීම ... වාර්ෂිකව සේලයින් හා ඒ ආශ්‍රිත නිෂ්පාද... ආනයනය සඳහා වැය වන ඇ.ඩො.මිලියන 2... මුදලක් රට තුළ ඉතිරි කිරීම |
| කුරුණෑගල ශික්ෂණ රෝහල | 2,323 (2008-11) | මාතෘ, පිළිකා හා හෘද වාට්ටු සංකීර්ණ, හදි... අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකක සඳහා නවී... වෛද්‍ය උපකරණ හා විද්‍යාගාර පහසුක... වලින් යුතු අංග සම්පූර්ණ නවීන රෝහල... බවට පත්කිරීම |
| අනුරාධපුර මහ රෝහල | 1,562 | බාහිර රෝගී අංශය, දන්ත වෛද්‍ය ඒකක... මාතෘ හා ළමා රෝග ඒකක, පිළිකා මර්ධ... සේවාවන් ඇතුළු අවශ්‍ය යටිතල හා උපකර... සම්පාදනය කරමින් නවීන පහසුකම් වලි... යුතු අංග සම්පූර්ණ රෝහලක් බවට පත් කිරී... |
| ගොඩගම රෝහල | 6,100 | දැඩි සත්කාර ඒකකය, බාහිර රෝගී අංශ... ශල්‍යාගාර, වාට්ටු පහසුකම් හා රෝ... හඳුනාගැනීමේ පහසුකම්, වෛද්‍යවරු ... අනෙකුත් කාර්යය මණ්ඩල සඳහා නිල නිවා... පහසුකම් වලින් සමන්විත අංග සම්පූර්... රෝහලක් පිහිටුවීම තුළින් මාතර ප්‍රදේශ... ජනතාවට විශේෂඥ වෛද්‍ය සේවාවන් ල... ගැනීමේ පහසුකම් සැලසීම |
| අපස්මාර තෘතියික සේවා මධ්‍යස්ථානය - ජාතික රෝහල, කොළඹ | 2,750 | ස්නායු ක්ෂතිය හා ස්නායු ශල්‍ය රෝගීන්... සඳහා පහසුකම් සැලසීමත් පාලනය කළ... නොහැකි රෝගීන් සඳහා එයට විශේෂි... සේවාවන් එක් මධ්‍යස්ථානයකින් ලබ... ගැනීමේ පහසුකම් සලසමින් ගුණාත්මක... කාර්යක්ෂම වෛද්‍ය සේවාවක් කඩිනමින් ලබ... දීම |

# 10. සංස්කෘතික කටයුතු

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

2006 - 2016

## ඉදිරි දැක්ම

දේශීයමය සංස්කෘතික, ආගමික හා කලාත්මක වටිනාකම් සාමාන්‍ය ජන ජීවිතයට ඒකාබද්ධ කරමින් එම වටිනාකම් තිරසාර පදනමකින් යුතුව ලෝකයෙහි අනෙකුත් රටවල් සමග ඒකාබද්ධ කිරීම

## ප්‍රධාන අරමුණු

- ජාතියේ අනාගත පැවැත්ම සඳහා අපටම අනන්‍ය වූ සංස්කෘතියක අවශ්‍යතාවය පැහැදිලි කරගැනීම
- ශ්‍රී ලංකාව සතු සංස්කෘතික උරුමයන් හා ඊට අදාල සමාජ දර්ශනයෙහි හරවත් පදනම මැනෙවින් හඳුනාගැනීම, වැඩිදියුණු කිරීම හා එහි අගය මනයෙහි තහවුරු කිරීම
- නවීකරණය සමග පැන නගින අහිතකර බලපෑම් වලින් දේශීය සංස්කෘතිය ආරක්ෂා කිරීම

## උපායමාර්ග

- ජාතික අනන්‍යතාව ගොඩනැගීම
- සංස්කෘතික උරුමයන් ඒකාබද්ධ කිරීම
- නිවැරදි භාෂා හා සාහිත්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම
- කලා හා ශිල්පීය දක්ෂතා නැවත ගොඩනැගීම
- සංස්කෘතික අගයන් ආරක්ෂා කිරීම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | පිරිවැය (රු. මිලියන) | අරමුණ |
|---|---|---|
| මහනුවර කුණ්ඩසාලේ කලා නිකේතනය | 465 | සියලුම කලාකරුවන්ට එක් ස්ථානයකදී කලා කටයුතුවල යෙදීමට අවශ්‍ය පහසුකම් සැපයීම |
| සීගිරිය කෞතුකාගාරය | 220 | ජාතික උරුමයන් රැකගැනීම, ආරක්ෂා කිරීම හා අනාගත පරපුරට දායාද කිරීම |

# 11. ක්‍රීඩා

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
2006 - 2016

## ඉදිරි දැක්ම

වර්ෂ 2016 වන විට මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් පිරිපුන් ශක්තිමත් ක්‍රීඩාශීලී රටක් බවට ශ්‍රී ලංකාව පත් කරලීම.

## අරමුණු

- ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා ක්‍රීඩා පුහුණු වීමේ හා සහභාගිවීමේ අවස්ථා ලබාදීම හා ඒ සඳහා අවශ්‍ය භෞතික සම්පත් වර්ධනය කිරීම.
- ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාල අධ්‍යාපන, තාක්ෂණ හා වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම.
- ක්‍රීඩා හා යෞවන කටයුතු සඳහා කාලීන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

## ඉලක්ක

- වසර 2012 දී ඔලිම්පික් තරඟයේදී අවම වශයෙන් ඉහළ පදක්කම් 05ක් පමණ හා අනෙකුත් ජාත්‍යන්තර තරඟ වලදී වැඩි පදක්කම් සංඛ්‍යාවක් ලබා ගැනීම
- ශක්තිමත් කණිෂ්ඨ ක්‍රීඩා සංචිතයක් ඇති කිරීම
- සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම අංග සම්පූර්ණ ක්‍රීඩා සංචිතයක් ඇති කිරීම
- ක්‍රීඩා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම

## උපාය මාර්ග

- ක්‍රීඩා ශක්ති වැඩසටහන යටතේ ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගත් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.
- ග්‍රාමීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතාවයන් උසස් තලයකට ගෙන ඒම සඳහා ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව ක්‍රීඩා සංකීර්ණ, ක්‍රීඩා භූමි, ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන ආදියෙහි පහසුකම් වැඩිදියුණු කිරීම.
- නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න ජාතියක් ඇතිකිරීම සඳහා සෑම ළමයෙකුම අරමුණු කොටගත් ශාරීරික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වසර 2008 දී ක්‍රීඩාව විෂයයක් ලෙස උපාධි මාලාවට ඇතුළත් කිරීම.
- ඔලිම්පික් තරඟ පැවැත්වෙන වර්ෂයට සමාන්තරව වසර 04 කට වරක් පැවැත්වෙන ජාතික ක්‍රීඩා වර්ණ ප්‍රදානයේදී අන්තර්ජාතික ජයග්‍රහණ ලැබූ ක්‍රීඩික ක්‍රීඩිකාවන් හා ඒ සඳහා මඟපෙන්වීම් ලබාදුන් පුහුණුකරුවන්හට වර්ණ ප්‍රදානය කිරීම.

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | පිරිවැය (රු. මිලියන) | අරමුණ |
|---|---|---|
| නුවර එළිය අධි උන්නතාංශ ක්‍රීඩාංගන සංකීර්ණය | 1967 | ටෙනිස්, පිහිනුම්, අශ්වන් පිට යෑම, කඳුකර බයිසිකල් පැදීම, පාපන්දු, ක්‍රිකට්, ස්කොෂ්, රග්බි හා ගෘහස්ථ ක්‍රීඩා වලට අවශ්‍ය පහසුකම් මෙන්ම පිහිණුම් තටාක, නේවාසිකාගාර හා අධි උන්නතාංශ ක්‍රීඩා පහසුකම් වලින් යුතු අංග සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණයක් ඉදි කිරීම. |
| රිධී ඇවනිව් ක්‍රීඩා සංකීර්ණය | 770 | ජාත්‍යන්තර තලයේ සියළු පහසුකම් වලින් සමන්විත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම. |
| මාතර - ගොඩගම ක්‍රීඩා සංකීර්ණය | 780 | මලල ක්‍රීඩා, ගෘහස්ථ ක්‍රීඩා, පිහිණුම් තටාංගන ආදී සියළු පහසුකම් වලින් සමන්විත අංග සම්පූර්ණ නවීන ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම. |

# 12. විද්‍යාව හා තාක්ෂණය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
**2006 - 2016**

## ඉදිරි දැක්ම

පූර්ණ පරිගණක සාක්ෂරතාව, විශිෂ්ට විද්‍යා අධ්‍යාපනය සහ ප්‍රමුඛ විද්‍යා හා තාක්ෂණ හුවමාරු තුළින් ග්‍රාමීය දිළිඳුකම අවම කර වසර 2016 වන විට දැනුම හා විද්‍යාව මත පදනම් වූ නවීන සංවර්ධිත රටක් බවට ශ්‍රී ලංකාව පත් කරලීම.

## ප්‍රධාන අරමුණු

- රටේ සෑම පුරවැසියෙකු වෙතම එලදායී ලෙස සමීප වන ජාතික විද්‍යා සංස්කෘතියක් පෝෂණය කිරීම.
- රටට ප්‍රමාණවත් උසස් තත්වයේ විද්‍යාඥයන් හා තාක්ෂණඥයන් බිහි කර ජාතික සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම.
- විද්‍යා හා තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදනයන් හා නව නිපැයුම් දිරිමත් කිරීම.
- ස්වදේශීය දැනුම හා තාක්ෂණ භාවිතය දිරි ගැන්වීම හා තවදුරටත් සංවර්ධනය කිරීම.
- ස්වාභාවික ව්‍යසන හා උවදුරු වල හානිදායක බලපෑම් අඩු කිරීමට හා කළමනාකරණයට විද්‍යා හා තාක්ෂණ භාවිතය දිරි ගැන්වීම

## ඉලක්ක

| නිර්ණායක | 2006 | 2010 | 2016 |
|---|---|---|---|
| පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ දායකත්වය (%) | 0.2 | 1.0 | 1.5 |
| විද්‍යාත්‍මක මධ්‍යස්ථාන | 163 | 326 | 326 |

## උපාය මාර්ග

- විද්‍යා අධ්‍යාපන පහසුකම් දියුණු කිරීම. පුළුල් කිරීම හා අධ්‍යාපන විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය
- විද්‍යා ප්‍රවර්ධන හා ජනප්‍රිය කිරීමේ වැඩසටහන්
- ජාතික සංවර්ධනයෙහි ලා තීරණාත්මක ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා රටින් පිට සිටින ශ්‍රී ලාංකික විද්‍යාඥයන් හා තාක්ෂණඥයන් උපදේශකයන් ලෙස යොදා ගැනීම
- නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා ත්‍යාග ප්‍රදානයන් සහ බුද්ධිමය දේපළ අයිතිය සුරැකීම
- තාක්ෂණ හුවමාරු වැඩසටහන්

## ප්‍රධාන ව්‍යාපෘති

- නිතිකි තාක්ෂණ වැඩසටහන (2007-2011)
  - මුළු පිරිවැය රු.මි. 5620 (රාජ්‍ය- පෞද්ගලික හවුල්)
- බහු කාර්ය ගැමා (2006-2009) ප්‍රවිකිරණාගාරය
  - මුළු පිරිවැය රු.මි. 503.3 (දේශීය අරමුදල්))

# 13. පරිසර කළමනාකරණය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
2006 - 2016

## ඉදිරි දැක්ම

වර්තමාන හා අනාගත පරපුරෙහි ජීවන තත්වයට හානි නොකරන, පරිසර තිරසාරභාවය, ජෛව විවිධත්වය සහ ස්වභාවික පරිසරයෙහි ඵලාදායිත්වය සුරකින ස්වභාව ධර්මයට එකග වූ භූමියක් සහතික කරලීම..

## ප්‍රධාන අරමුණු

- ජාතික ආදායම සහ ජනතාවගේ යහ පැවැත්ම උදෙසා උපරිම දායකත්වය තහවුරු කිරීමට දායක වන අයුරින් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම
- ජෛව විවිධත්වය සඳහා වන ජීවීන් සුරැකීම
- පරිසරයට අවම බලපෑමක් සිදුවන සේ ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත් නිෂ්පාදනය, ප්‍රවර්ධනය, ඒකක අගය වැඩි කිරීම සහ නිෂ්පාදන මට්ටම පවත්වාගෙන යාම.
- මනා අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- භූමි සම්පත් හායනය අවම කිරීම.
- වායු හා සමුද්‍ර දූෂණය වැලැක්වීම
- ජලය හා ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම.

## ඉලක්ක

| නිර්ණායක | 2006 | 2010 | 2016 |
|---|---|---|---|
| වන සම්පත් වලින් ආවරණය වූ භූමි ප්‍රතිශතය (%) | 29 | 31 | 33 |
| අධිරක්ෂිත ප්‍රදේශ සංඛ්‍යාව | 2 | 3 | 5 |
| ස්වභාවික රක්ෂිතයන් සංඛ්‍යාව | 3 | 5 | 7 |
| ජාතික වනෝද්‍යාන සංඛ්‍යාව | 15 | 22 | 25 |
| කැලෑ මං පෙත් සංඛ්‍යාව | - | 2 | 5 |
| සමුද්‍ර රක්ෂිත සංඛ්‍යාව | 1 | 2 | 5 |
| උද්භිද උද්‍යාන සංඛ්‍යාව | 3 | 8 | 10 |
| අන්තර්ජාතික වැදගත්කමක් සහිත තෙත් බිම් සංඛ්‍යාව | 3 | 7 | 7 |
| ලෝක උරුමස්ථාන සංඛ්‍යාව | | | |
| සංස්කෘතික | 6 | 8 | 10 |
| ස්වභාවික | 1 | 2 | 4 |
| නිපදවන මුළු අපද්‍රව්‍ය ප්‍රමාණයට අනුව පරිසර හිතකාමී ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රතිශතය | 1 | 75 | 100 |
| මහ නගර සභා | 30 | 75 | 100 |
| නගර සභා | 50 | 100 | 100 |
| ප්‍රාදේශීය සභා | | | |

## උපාය මාර්ග

- රජයට අයත් ඉඩම්වල තිරසාර භූමි භාවිතය දිරිමත් කිරීම
- පෞද්ගලික වන වගාව සහ වෘක්ෂ සම්පත් සංවර්ධනය
- වන සම්පත් ආශ්‍රිත නිෂ්පාදනය, කර්මාන්ත සහ අලෙවිකරණය දියුණු කිරීම
- පරිසර දූෂණය අඩු කරන යෝග්‍ය තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම
- ඛනිජ සම්පත් නිෂ්පාදනය සඳහා තිරසාර නිස්සාරණ ක්‍රම භාවිතය
- ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම හඳුන්වා දීම
- අන්තර්ජාතික සම්මුතීන් හා එක්ව ක්‍රියා කිරීම

## ප්‍රධාන ව්‍යාපෘති

- වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (2001-2009)
  - මුළු පිරිවැය රු.මි. 3550
- පිළිසරු කසල කළමනාකරණ වැඩසටහන (2008-2010)
  - මුළු පිරිවැය රු.මි. 5675
- පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (2007-2009)
  - මුළු පිරිවැය රු.මි. 302

# 14. රාජ්‍ය පරිපාලනය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
2006 - 2016

## ඉදිරි දැක්ම

ඵලදායි හා කාර්යක්ෂම, සේවාලාභී සුහදතාවයකින් යුත්, දූෂණයෙන් තොර විනිවිද භාවයෙන් සහ වගකීමෙන් යුත් රාජ්‍ය සේවයක් ජාතික හා පළාත් මට්ටමෙන් ස්ථාපනය කිරීම.

## ප්‍රධාන අරමුණු

- ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් රාජ්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය ශක්තිමත් කිරීම.
- විවිධ මට්ටම් වලින් රාජ්‍ය සේවය සැපයීමේදී සේවාලාභියා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- රාජ්‍ය සේවාවේ මනා සම්පත් කළමනාකරණය සහ ඵලදායිතාවය ඉහල නැංවීම.
- කාර්යක්ෂම පළාත් පාලන සේවාවක් ස්ථාපිත කිරීම.

## උපාය මාර්ග

- ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ බලතල සහ වගකීම් පැහැදිලිව නිර්ණය කර බෙදා හැරීම මගින් ඒ ඒ ආයතන අතර සිද්ධවන වගකීම් වල ද්විත්වකරණය අවම කිරීම.
- මහජන අදහස් හා අභිලාශයන් වෙත යොමු-වෙමින් සහයෝගිතා රාජ්‍ය සේවයක් සැපයීම.
- මිලදී ගැනීම් හා කොන්ත්‍රාත් කටයුතු වල විනිවිදභාවය තහවුරු කිරීම.
- මූල්‍ය විනිවිද භාවය ශක්තිමත් කිරීම සඳහා ශක්තිමත් විගණන ක්‍රියාවලියක් මත පදනම් වූ මූල්‍ය වාර්තා කරන ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

- උපරිම විනිවිද භාවයෙන් යුත් රාජ්‍ය සේවාවක්
- ජනතාවට සමීප කඩිනම් සේවා සැපයීම.
- කාර්යක්ෂම, තෘප්තිමත්, අවංක සහ සේවයට කැපවූනු රාජ්‍ය සේවකයින් පිරිසක්
- නව කළමනාකරණ ක්‍රමවේද-යන්ගෙන් යුත් පරිපාලන රටාවක්
- ද්විත්වකරණයෙන් තොර ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන යාන්ත්‍රණයක්

## ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය (රු.මිලියන) |
|---|---|
| රාජ්‍ය නිලධාරීන් සඳහා ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම | 335 |
| සිවිල් පරිපාලනය ශක්තිමත් කිරීමේ වැඩසටහන | 600 |
| ප්‍රා.ලේ., දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා නිල නිවාස | 274 |

# 15. නීති හා අධිකරණ පද්ධතිය

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

2006 - 2016

## ඉදිරි දැක්ම

කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුත් සැමට සාධාරණ වූ අධිකරණ හා නීති පද්ධතියක් ස්ථාපිත කිරීම.

## ප්‍රධාන අරමුණු

- පෞද්ගලික ආයෝජන හා වාණිජමය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා නවීන වාණිජ නීති ක්‍රම හඳුන්වා දීම.
- විශේෂිත පුහුණු වැඩසටහන් තුළින් නීති හා නියාමන ආයතනයන්හි නීති කෙටුම්පත් සැකසීමේ කාර්යක්ෂමතාවය සහ හැකියාව වැඩි දියුණු කිරීම.
- නවීන තොරතුරු තාක්ෂණය හා විද්‍යුත් උපකරණ හඳුන්වාදීම තුළින් නීති හා අධිකරණ පද්ධතියෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- සුළු ආරාවුල් සඳහා වන විකල්ප විසඳුම් ඇතුලත් යාන්ත්‍රණයක් ආයතනගත කිරීම තුළින් නඩු මාර්ග කරා යාමේ ප්‍රවණතාවය අවම කිරීම.
- අඩු ආදායම්ලාභීන්, ළමුන් සහ කාන්තාවන් යන වධාත් පීඩාවන්ට ලක්වන කණ්ඩායම් වල සමාජ සාධාරණත්වය තහවුරු කිරීම උදෙසා නීති ආධාර සැපයීම.

## ඉලක්ක

- උසාවි ක්‍රමය තුල මනා කළමනාකාරිත්වයක් ඇති කිරීම.
- ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් සංවර්ධනය.
- අධිකරණ කටයුතු විමධ්‍යගත කිරීම.
- අධිකරණ ක්‍රමය තුළ තොරතුරු තාක්ෂණය වැඩි දියුණු කිරීම.
- නීති ප්‍රතිසංස්කරණ තුළින් නඩු වියදම් අවම කිරීම.

## උපාය මාර්ග

- පවත්නා දත්ත හා තොරතුරු පරිගණක ඇසුරින් යාවත්කාලීන කිරීම.
- අධිකරණ හා නීති නිලධාරීන්ගේ නිපුණතා ඉහල නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- අධිකරණ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- ප්‍රාදේශීය වශයෙන් උසාවි සංකීර්ණ නවීකරණය කිරීම.

## අපේක්ෂිත තත්වයන්

- ප්‍රමාදයන්ගෙන් තොර ජනතා සේවයක් ලබා දීම.
- වාණිජ ක්‍රියාකාරකම් නියාමනය තුළින් මහජන සුභසාධනය.
- පරිගණක ගත කරන ලද අධිකරණ සංස්ථා හා උසාවි.
- මනා පරිචයකින් යුත් නීති හා අධිකරණ නිලධාරීන්.

## ප්‍රධාන ව්‍යාපෘති

- නීති හා අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය.
- මීගමුව, තංගල්ල, මාරවිල, හොරණ, නාවලපිටිය සහ නුවර එළිය යන නගර වල නව අධිකරණ සංකීර්ණ ඉදිකිරීම
- අභියාචනාධිකරණය ප්‍රාදේශීය වශයෙන් විමධ්‍යගත කිරීමේ වැඩසටහන්.

# 16. ගැටුම් වලින් හානියට පත් දිස්ත්‍රික්ක සංවර්ධනය

දස අවුරුදු දැක්ම
සංවර්ධන ප්‍රතිපත්ති රාමුව
**2006 - 2016**

## ඉදිරි දැක්ම

සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුලින් එදිනෙදා ජීවනෝපායන්හි නිරත විය හැකි වන පරිදි, ත්‍රස්තවාදී ගැටුම් වලින් පීඩාවට පත් ප්‍රදේශ සමෘද්ධිමත් තත්වයට ගෙන ඒම.

## ප්‍රධාන අරමුණු

- ගැටුම් නිසා පීඩාවට පත් පවුල් සඳහා හදිසි සහන සේවා සහ මූලික අවශ්‍යතාවන් සැපයීම.
- ඔවුනට තිරසාර ජීවනෝපාය සංවර්ධනයක් සහතික කිරීම.
- ජනවාර්ගික එකමුතුව ඇති කිරීම තුළින් සහජීවන පරිසරයක් නිර්මාණය කිරීම.

## උපාය මාර්ග

- අවතැන් වූ පවුල් නැවත පදිංචි කරවීම.
- මූලික අවශ්‍යතා සහ යටිතල පහසුකම් සැපයීම.
- ආදායම් උත්පාදන මාර්ග සඳහා සහය දීම.
- සමාජ හා සංස්කෘතික ප්‍රබෝධය ඇති කරලීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

- උතුරු හා නැගෙනහිර පළාත් වලට ත්‍රස්තවාදයෙන් තොර ගෞරවනීය සාමයක්.
- රටේ අනෙකුත් ප්‍රදේශවල ආර්ථිකයන් හා සම්බන්ධ කරවීම තුළින් උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා සමෘද්ධිමත් ආර්ථිකයක්.
- සංස්කෘතික හා ආගමික එකමුතුභාවයෙන් යුත් සමාජයක්.

# ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ආයෝජනය (රු.මිලියන) |
|---|---|
| ගැටුම් වලින් හානියට පත් ප්‍රදේශ පුනරුත්ථාපනය (2004-2008) | 10,000 |
| උතුරු නැගෙනහිර නිවාස ප්‍රතිසංස්කරණය (2005-2009) | 9,000 |
| උතුරු නැගෙනහිර ප්‍රජා ප්‍රතිස්ථාපන සංවර්ධන වැඩ සටහන II (2005-2009) | 5,500 |
| උතුරු නැගෙනහිර වාරිමාර්ග, කෘෂිකර්මාන්ත ව්‍යාපෘතිය II (2005-2010) | 7,842 |
| උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය (2004-2010) | 2,840 |
| ආරක්ෂිත සහන හා නැගාසිටුවීමේ වැඩසටහන | 7,459 |

# 17. සාර්ව ආර්ථික දැක්ම

දස අවුරුදු දැක්ම

සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

**2006 - 2016**

## ඉදිරි දැක්ම

ඉදිරි දශකය තුළ දළ දේශිය නිෂ්පාදිතයෙහි 8% - 10% ත් අතර වාර්ෂික වර්ධන වේගයක් පවත්වාගනු ලබන අතර 2016 වන විට රුපියල් 485,000 ක (ඇ. එ. ඩොලර් 3,960) පමණ ඒක පුද්ගල ආදායමකට හිමිකම් කියනු ලබන මධ්‍යම ආදායම් කාණ්ඩයට අයත් ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාව පත් කරලීම .

## සාර්ව ආර්ථික උපාය මාර්ග

- අදාල පාර්ශවයන් අතර එකඟතාවයක් ඇති කර ගැනීම තුළින් සාමය උදාකර ගැනීම පිණිස පිළිගත හැකි විසඳුමකට එළඹීම.
- නිදහස් ආර්ථික ක්‍රමයක් පවත්වාගෙන යාම.
  - හිතකර බදු ක්‍රමයක් ස්ථාපිත කිරීම.
  - බහු හා ද්වි පාර්ශවික වෙළඳ ගිවිසුම් හරහා හිතකර වෙළඳපලකට පිවිසීමට පහසුකම් සැපයීම.
  - එකතුකල වටිනාකම් සහිත නිෂ්පාදන දිරිමත් කිරීම.
  - අපනයනාභිමුඛ නිෂ්පාදන දිරිමත් කිරීම.
- ධාරිතා ප්‍රසාරණය ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම තුළින් රාජ්‍ය, පෞද්ගලික හා විදේශ ආයෝජන දිරිමත් කිරීම හා ආර්ථිකයේ සියලුම අංශ වල නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම .
- යටිතල පහසුකම් සංවර්ධනය
  - පවත්නා මාර්ග ජාලය ගුණාත්මක අයුරින් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සහ අධිවේගී මාර්ග පද්ධතියක් ඉදිකිරීම.
  - විදුලිබල උත්පාදනය හා බෙදාහැරීම පුළුල් කිරීම සහ විකල්ප බලශක්ති ප්‍රභවයන් වෙත වැඩි වශයෙන් යොමුවීම .
  - පිරිසිදු පානීය ජල සැපයුම පුළුල් කිරීම.

    වරාය හා ගුවන් තොටුපල නවීන ගුවන් සහ නාවික මධ්‍යස්ථාන සේවා සැපයුම් ස්ථාන බවට පරිවර්තනය කිරීම
- මානව සම්පත් සංවර්ධනය
  - ප්‍රාථමික, ද්විතියික හා තෘතික මට්ටමේ අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම, සහ එහි ගුණාත්මකභාවය ඉහල නැංවීම .
  - ඉහල ගුණාත්මක බවකින් යුත්සෞඛ්‍ය සේවයක් සැමට සමාන අයුරින් සැපයීම.
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ නව තාක්ෂණය වැඩි දියුණු කිරීම. පර්යේෂණ හා සංවර්ධන කටයුතු වල භාවිතය ඉහළ නැංවීම.

## ප්‍රධාන ආර්ථික අරමුණු

- දිළිඳුකම පිටුදැකීම හා දිළිඳුකමේ ප්‍රාදේශීය විෂමතා අවම කරලීම.
- සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතා දුරලීම.
- ඉහල ආර්ථික වර්ධන වේගයක් අත්කර ගැනීම හා එය අඛණ්ඩව පවත්වාගෙන යාම.
- උද්ධමන අනුපාතය පහල මට්ටමක පවත්වාගෙන යැම.
- අයවැය හිඟය පහත හෙළීම.
- දේශීය හා විදේශීය ආයෝජන දිරිමත් කිරිම.
- දේශීය ඉතිරි කිරිම් ඉහල නැංවීම
- යහපත් ගෙවුම් ශේෂ තත්වයන් පවත්වා ගැනීම.

## දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික වර්ධන අනුපාතයන්

| අංශය | වාර්ෂික ඉලක්ක | | |
|---|---|---|---|
| | 2006 | 2010 (ආ) | 2016 (ආ) |
| කෘෂිකාර්මික අංශය | 6.3 | 5.0 | 5.0 |
| කාර්මික අංශය | 8.1 | 8.6 | 10.5 |
| සේවා අංශය | 7.7 | 9.2 | 11.5 |

(ආ) පුරෝකථන
මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**I. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය**

- ආදායම් හිඟය ආදායම් අතිරික්තයක් බවට පත්කර ගැනීම.
- රාජ්‍ය ව්‍යවසාය-යන්ගෙන් බද්ද නොවන ආදායම් වැඩිපුර ලබා ගැනීම.
- රාජ්‍ය වියදම් මනා ලෙස කළමණාකරණය කිරීම.
- කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය දියුණු කිරීම පිණිස මැදිකාලීන ආංශික අය වැය රාමුවක් තුල රාජ්‍ය වියදම් සැලසුම් කිරීම.

**II. මුදල් හා මූල්‍ය ප්‍රතිපත්තිය**

- රක්ෂණ හා මූල්‍ය සේවාවන් හි නියාමන රාමුව වැඩිදියුණු කිරීම.
- ඉහල පොලී අනුපාතය අඩු කිරීම සඳහා ක්‍රියා මාර්ග හඳුන්වා දීම.
- බැංකු සහ මූල්‍ය ආයතන තම මූල්‍ය ශක්‍යතාවය වැඩි දියුණු කර ගැනීම සඳහා යොමු කරවීම.

**III. ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීමේ නිදහස් ප්‍රතිපත්තිය**

- විදේශිකයින් සඳහා රුපියල් පදනම් කොටගත් භාණ්ඩාගාර බැදුම්කර වෙළඳපොල විවෘත කරලීම.
- රජයේ අයවැය හිඟය පියවීම සඳහා තරඟකාරී අයුරින් ප්‍රාග්ධන වෙළඳපොල ශක්තිමත් කිරීම තුළින් මූල්‍ය සම්පත් ලබා ගැනීම.

**IV. වෙළඳ ප්‍රතිපත්තිය**

- වරණීය වෙළඳ ප්‍රවේශ වැඩසටහන් තුලින් අන්තර් ජාතික වෙළඳපලට අවතීර්ණ වීම.
- කලාපීය වෙළඳ සබඳතා ශක්තිමත් කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට වැඩි අවධානයක් යොමු කරමින් අපනයන අංශය විවිධාංගී-කරණය කිරීම.
- ආර්ථික අවශ්‍යතාවන් ප්‍රවර්ධනය සඳහා විදේශ දූත සේවාවන් යලි ක්‍රමවත් කිරීම

| දර්ශකය | ඒකකය | 2006 | 2010 (අ) | 2016 (ආ) |
|---|---|---|---|---|
| ද.දේ.නි. වර්ධන වේගය | % | 7.7 | 8.5 | 10.6 |
| වෙළඳපල මිල අනුව ද.දේ.නි. | රු. බිලියන | 2924.2 | 4960.6 | 10,977.4 |
| මුළු ආයෝජන | ද.දේ.නි % | 28.0 | 33.5 | 36.5 |
| - රාජ්‍ය ආයෝජන | ,, | 4.1 | 8.2 | 8.2 |
| - පෞද්ගලික ආයෝජන | ,, | 23.9 | 25.3 | 28.3 |
| දළ දේශීය ඉතිරි කිරීම | ,, | 17.0 | 21.0 | 27.2 |
| දළ ජාතික ඉතිරි කිරීම | ,, | 22.3 | 28.7 | 33.7 |
| සමස්ථ අය වැය හිගය | ,, | -8.0 | -5.0 | -3.5 |
| රාජ්‍ය ණය | | 88.7 | 77.2 | 52.2 |
| දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය | | 11.2 | 5.5 | 3.8 |
| ඒක පුද්ගල ද. දේ.නි. (වෙළඳපළ මිල අනුව ) | රු. දහස් | 147 | 234 | 487 |

(අ) තාවකාලික (ආ) පුරෝකථන

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව*
*ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*
*දස අවුරුදු සංවර්ධන රාමුව , 2006 -2016*